# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,111 - 2019 පෙබරවාරි මස 15 වැනි සිකුරාදා - 2019.02.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

### තනතුරු ඇබෑර්තු

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ III වන ශ්‍රේණියේ පශු වෛද්‍ය නිලධාරි තනතුරු සඳහා බඳවා ගැනීම - 2019**

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ III වන ශ්‍රේණියේ පශු වෛද්‍ය නිලධාරි තනතුරු එකසිය එකොළහක් (111) සඳහා පත්කිරීමට සුදුස්සන් තෝරා ගැනීම සඳහා පශු වෛද විද්‍යා උපාධිධාරීන්ගෙන්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස උඩ කෙළවරේ, ''ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ III වන ශ්‍රේණියේ පශු වෛද්‍ය නිලධාරී තනතුර'' යනුවෙන් පැහැදිලිව සටහන් කල යුතුය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2019.03.22 වේ.

*සටහන* : ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින් දැරිය යුතුය. මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

1. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :

(i) පශු වෛද්‍ය නිලධාරී තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශු වෛද්‍ය පීඨය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන කුසලතා ලේඛනය මත බඳවා ගනු ලබනවා ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් විශ්වවිද්‍යාලයකින් පශු වෛද්‍ය උපාධි සුදුසුකම් ලබා ගන්නා අයදුම්කරුවන් ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචිය සඳහා සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන වසරට අදාළව ලියාපදිංචි දිනය අනුව අනුපිළිවෙලින්, කුසලතා ලේඛනයේ අවසානයට ඇතුළත් කරනු ඇත.

(ii) පුරප්පාඩු සංඛ්‍යාවෙන් සියයට එක්සිය දහයක (110%)කට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, කුසලතා ලේඛනයේ අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගැනීම සිදු කෙරේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදීමක් සිදු නොකෙරේ.

(iii) පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

2. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ.

(ii) තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ පශු වෛද්‍ය නිලධාරි තනතුරක පුරප්පාඩු පිරවීම සඳහා පත් කරනු ලැබේ.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1/2014 අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවයක් ලබාගත යුතුවේ. රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයෙන් සේවයට පත් කිරීමට සුදුසුකම් ලැබූ නිලධාරියෙකු තනතුරෙහි ස්ථිර කිරීමට පෙර රාජ්‍ය භාෂාවක III මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා ගත යුතු වේ.

(iv) සෙසු සේවා නියමයන් සහ සේවා කොන්දේසි 2013.12.13 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ හා වරින්වර නිකුත් කරන ලද සංශෝධන නියමයන්වලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

3. *වැටුප් පරිමාණය* :

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 47,615 - 10 x 1335 - 8 x 1630 - 17 x 2170-රු. 110,895 (SL-1-2016) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

4. *අධ්‍යාපන සුදුසුකම්* :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධියක්

5. *වයස් සීමාව* :

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

6. *කායික සුදුසුකම්* :

(i) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්,

(ii) තනතුරෙහි රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු අතර, මනා ශරීර සෞඛ්‍ය තත්වය වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් සනාථ විය යුතුය.

7. *වෙනත් සුදුසුකම්* :

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(ii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචිය තිබීම ඇතුළුව මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

8. *සම්මුඛ පරීක්ෂණය* :

8.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : (ලකුණු ලබා දෙනු නොලැබේ.)

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : බඳවා ගැනීමේ පරිපාටි හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම.

9. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

(i) ඉල්ලුම්පත්‍රය සෙ. මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් ආදර්ශ අයදුම්පත් අනුව සකස් කළ යුතුය.

(ii) සම්මුඛ පරීක්ෂණය සඳහා දැනුම් දුන් විට පහත සඳහන් ලියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(*a*) උප්පැන්න සහතිකය ;

(*b*) උපාධිය හා අදළ වෙනත් සහතික ;

(*c*) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (මින් එකක් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් හා ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කළ යුතුය) ;

(*d*) සිංහල/දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් සමත් වූ උසස්ම විභාගවල සහතික ;

(*e*) පශු වෛද්‍යවරයෙකු වශයෙන් ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචිවීමේ සහතිකය.

10. *වෙනත් විධිවිධාන* :

(i) මෙම *ගැසට්* නිවේදනයේ විධිවිධාන පනවා නොමැති කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වනු ඇත.

(ii) පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ කොටසක් පමණක් පිරවීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

(iii) මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨ බල පැවැත්විය යුතුය.

(iv) අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු වනු ඇත.

(v) අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇතිනම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

කේ. ඩී. එස්. රුවන්චන්ද්‍ර,
ලේකම්.

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන,
වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය.
2019 ජනවාරි මස 30 වැනි දින.

**ආදර්ශ අයදුම්පත**

***ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ III වන ශ්‍රේණියේ පශු වෛද්‍ය නිලධාරි පුරප්පාඩුවලට බඳවා ගැනීමේ අයදුම්පත***

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

01. (i) මුලකුරු සමග නම :
සිංහලෙන් :————.
ඉංග්‍රීසියෙන් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 මාර්තු මස 08 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 පෙබරවාරි මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය.''*

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

02. ජාතික හැඳුනුම්පත් අංකය :

03. තැපැල් ලිපිනය :————.
(ලිපිනයෙහි යම් වෙනසක් සිදු වුවහොත්, වහාම ඒ බව දැනුම් දිය යුතුය.)

04. ස්ථිර පදිංචි ස්ථානය අයත් :
(i) පළාත් සභාව :————.
(ii) දිස්ත්‍රික්කය :————.

05. උපන් දිනය : වර්ෂය :————., මාසය :————., දිනය :————.
අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු :————. මාස :————. දින :————.

06. (අ) ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද යන බව :————.
(ආ) ජාතිය (සිංහල/ශ්‍රී ලංකා ද්‍රවිඩ/ඉන්දියානු ද්‍රවිඩ/මුස්ලිම්/වෙනත්) :————.

07. (අ) ස්ත්‍රී/පුරුෂ භාවය :————.
(ආ) විවාහක/අවිවාහක/වැන්දඹු ද යන වග :————.

08. අධ්‍යාපන සුදුසුකම් :

| *සමත්වූ උපාධිය/පශ්චාත් උපාධි සුදුසුකම* | *පන්තිය* | *විශ්ව විද්‍යාලය* | *උපාධිය සම්පූර්ණ කළ දිනය* |
|---|---|---|---|
| 1.<br>2.<br>3. | | | |

09. ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංකය හා දිනය :————.

10. සේවා විස්තර : (දැනට ස්ථිර තනතුරක් දරන්නේ නම්) :-

| දැනට දරන තනතුර | සේවා කාලය | | *සේවා ස්ථානය* | *දෙපාර්තමේන්තුව/ පළාත් සභාව* |
|---|---|---|---|---|
| | *සිට* | *දක්වා* | | |
| 1.<br>2.<br>3. | | | | |

11. මෙම ඉල්ලුම්පත්‍රයෙහි මවිසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු සත්‍යවූත්, නිවැරදි වූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි ඒවා බව මා තෝරාගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සෙකු වීමට යටත්වන බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මා කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත්, මම දැන සිටිමි. මම කිසිදු උසාවියකින් සාපරාධී වරදකට වැරදිකරුවකු වී නොමැති බව ද මගේ සුපුරුදු අත්සන තබා මින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(දැනට රජයේ ස්ථිර තනතුරක් දරන අපේක්ෂකයන්ට පමණක් අදාළ වේ.)

1. දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය :

ඉහත අයදුම්කරු වූ ................................................. මහතා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ ........................ පළාත් සභාවේ ........................ තනතුරක් දරන නිලධාරිවරයෙකු බවත් ඉල්ලුම්පත්‍රයේ සඳහන් තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා මෙම නිලධාරියා තේරී පත්වුවහොත් ඔහු/ඇය මෙම දෙපාර්තමේන්තුවෙන්/පළාත් රාජ්‍ය සේවයෙන් මුදා හැරීමට හැකි/නොහැකි බවත් දන්වමි.

(අදාළ නොවන වචන කපා හරින්න.)

:————.
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා
(නිල මුද්‍රාව)

දිනය :————.
ලිපිනය :————.

02-642

---

## විභාග, විභාග, ප්‍රතිඵල ආදිය

**කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග, සහ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ තාක්ෂණ නිලධාරි තනතුරට බඳවා ගැනීම - 2019

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්මේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ තාක්ෂණ නිලධාරි තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. *විභාගය* :-

2019 මැයි මාසයේ දී ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට අනුකූලව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් විභාගය පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

03. *සේවා කොන්දේසි* :

රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසි වලට ද, මෙහි පහත සඳහන් කොන්දේසිවලට ද යටත්ව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ තාක්ෂණ නිලධාරි තනතුරට බඳවා ගනු ලැබේ.

(i) පත් කරනු ලබන නිලධාරියා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත් වේ.

(ii) මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ විසින් වැන්දඹු හා අනත්දරු හා විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(iii) විවෘත බඳවා ගැනීම් යටතේ පත්කරනු ලබන නිලධාරීන් වසර 3 ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරන ලද නිලධාරියෙකු පත් කරනු ලැබුවහොත්, එක් වසරක පරීක්ෂණ කාල සීමාවකට යටත් කරනු ලැබේ. විවෘත බඳවා ගැනීම් තුළින් පත් කරනු ලබන නිලධාරින් තනතුරේ ස්ථිර කිරීමට පෙරාතුව, නියමිත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව තිබීම ද අවශ්‍ය වේ.

(iv) රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරින් සේවයට බැඳුනු රාජ්‍ය භාෂාවකට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතාවයක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතුය.

(v) පත්වීම් ලබන නිලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට ද, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, කාර්ය පරිපාටික රීතිවලට ද, රජය විසින් වරින්වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසිවලටත් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ රෙගුලාසිවලටත් යටත් වේ.

04. *වැටුප් පරිමාණය* :-

MN-3-2016 තාක්ෂණ නිලධාරි III

රු. 31,040 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 57,550

මෙම වැටුප් පරිමාණයේ රු. 31,040 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 57,550 වැටුප් පියවරයන් මෙම ශ්‍රේණියට හිමිවේ. (වැටුප් ගෙවනු ලබන්නේ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි උපලේඛන II හි සඳහන් පරිදිය)

III ශ්‍රේණියේ නිලධාරීන් තුන්වන වැටුප් වර්ධකය ලැබීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

05. *වයස් සීමාව* :
අවම සීමාව - වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතුය.
උපරිම සීමාව - වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

06. *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්* :

අධ්‍යාපන සුදුසුකම් :

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

සහ

ව්‍යවහාරික ගණිතය, ශුද්ධ ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යා/ගණිත විෂය ධාරාවන්ට අයත් විෂයයන් තුනකින් අ.පො.ස. (උසස් පෙළ) විභාගය එකවර සමත්වීම.

*වෘත්තීය සුදුසුකම්* :

මොරටුව විශ්වවිද්‍යාලයේ හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු (සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා) ඩිප්ලෝමාව ;

හෝ

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත ආයතනයක් විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු (සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා) ඩිප්ලෝමාව ;

හෝ

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණ ඩිප්ලෝමාව ;

හෝ

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළවන කොටස (සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා) සාර්ථකව සම්පූර්ණ කිරීම ;

හෝ

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

*කායික සුදුසුකම්* :

මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් හා විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු අතර, මනා ශරීර සෞඛ්‍ය තත්වය වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් සනාථ විය යුතු ය.

*වෙනත් සුදුසුකම්* :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
(ii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ, අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

07. *බඳවා ගැනීමේ ක්‍රමය* :
සියලු බඳවා ගැනීම්, අදාළ චක්‍රලේඛ උපදෙස් අනුව හා ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට අදාළව සිදු කෙරේ.

විවෘත තරග විභාගය සඳහා නියමිත සෑම ප්‍රශ්න පත්‍රයක ම 40% ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයින් කුසලතා අනුපිළිවෙල මත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීම සිදු නොකරන අතර, සුදුසුකම් තහවුරු කළ අයදුම්කරුවන් විභාගයේදී ලබාගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

08. විභාගය :
මෙම විභාගය ලිඛිත ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විතය.

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 2. පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) | පැය 01 | 100 | 40 |

(i) මෙම විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

(ii) අපේක්ෂකයින් කැමති භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකි අතර, විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍ර වලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය.

(iii) ඉල්ලීම් කරන ලද භාෂා මාධ්‍ය විභාගයේ දී වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

(iv) විභාග ගාස්තුව රු. 400

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට නිකුත් කරන ලද පේරාදෙණිය, තැපැල් කාර්යාලයෙන් මුදල් කර ගත හැකි වනසේ දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකින් ලබාගත් මුදල් ඇණවුමක් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය.

(v) විෂය නිර්දේශය :
(අ) බුද්ධි පරීක්ෂණය : කාලය පැය 1 යි. මුළු ලකුණු 100 යි

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියක් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය.

(ආ) පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) : කාලය පැය 1 යි. මුළු ලකුණු 100 යි පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

(i) මැනීම සහ මට්ටම් ගැනීම :

| | |
|---|---|
| දම්වැල් ගැනීම | මට්ටම් ගැනීම |
| තියොඩලයිට්ටුව භාවිතය පිළිබඳ දැනුම | තල මේස මැනුම් පිළිබඳ දැනුම |

(ii) ගොඩනැගිලි ද්‍රව්‍ය :
සිමෙන්ති, හුණුවැලි, ගල් තීන්ත වර්ග, වාර්නිෂ් වර්ග, ප්ලාස්ටික් සහ වීදුරු, ගොඩනැගිලි ද්‍රව්‍ය වශයෙන් යොදා ගනු ලබන හොඳ තත්වයේ දැව හඳුනා ගැනීමේ දැනුම

(iii) ගොඩනැගිලි ඉදි කිරීම හා ඇස්තමේන්තු පිළියෙල කිරීම :

අත්තිවාරම් බිත්ති බැඳීම, දැවවහලය, යකඩ කාප්ප, කුළුණු, කොන්ක්‍රීට් තලාද සහ කොන්ක්‍රීට් කුළුණු/අත්තිවාරම්/තට්ටු/තරප්පු ආදිය යොදනු ලබන ආකාරය සහ යොදනු ලබන අවස්ථා

මිනුම් ලබා ගැනීම, ඇස්තමේන්තු පිළියෙල කිරීම, ඉදි කිරීම සඳහා අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රමාණයන් සහ කම්කරුවන් සංඛ්‍යාව ඇස්තමේන්තු කිරීම.

(iv) ව්‍යුහ නම්‍යතා/ව්‍යාපෘති බල සටහන

(v) සේවාවන් - විදුලි, ජල, සනීපාරක්ෂක

09. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :- ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනය සමඟ ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. 8 1/2 x 12 (ඒ 4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කරගත් ඉල්ලුම්පත්‍රය 2019.03.08 දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ.පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහල කෙළවරේ ''තාක්ෂණ නිලධාරී III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සටහන :
(i) රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය ඉල්ලුම්පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.
(ii) සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේදී ඉල්ලුම්පත්‍ර නැතිවීම හෝ ප්‍රමාද වීම සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.
(iii) ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. විභාගය පැවැත්වෙන දිනය පුවත්පත් දැන්වීමක් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ. ඉල්ලුම්කරුවන්ට විභාග ප්‍රවේශපත්‍රය විභාගය පැවැත්වෙන දිනයට දින හතරකට කලින් නොලැබුනහොත් පහත සඳහන් විස්තර ඇතිව වහාම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට දැන්විය යුතුය.

i. අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :
ii. ලිපිනය :
iii. ඉල්ලුම්පත් තැපැල් කිරීමේ දිනය, ලියාපදිංචි අංකය, තැපැල් කාර්යාලය :

10. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය. :-
i. උප්පැන්න සහතිකය
ii අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් තහවුරු කිරීමේ සහතික

*අපේක්ෂකයාගේ අනන්‍යතාවය* :
විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාග ශාලාවේදී තමාගේ අනන්‍යතාව විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් ඔප්පු කර සිටිය යුතුය. ඒ සඳහා පහත ලේඛණ පිළිගැනේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් නිකුත් කරන ලද හැඳුනුම්පත්‍රය

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය. (විභාග දිනට අවුරුදු 3 කට කලින් නිකුත් කරන ලද)

සාවද්‍ය තොරතුරු සැපයීම :-

මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාග යට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හැකි වන්නේය. අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන දැන ඉදිරිපත් කළ බව පෙනී ගිය හොත් ඔහු සේවයෙන් පහ කිරීමට යටත් වන්නේය.

මෙම ගැසට් පත්‍රයේ 03 වන ඡේදයේ ප්‍රකාශිත රාජ්‍ය සේවයට පත් කිරීමට අදාලවන පොදු කොන්දේසි කෙරෙහි හා විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් කෙරෙහි අවධානය යොමු කර ඒවා පිළිපැදිය යුතුය.

11. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් පරස්පරතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැවිය යුතු වන්නේය.

12. මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටලුවක් මතු වුවහොත් ඒ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමේ බලය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සතුවේ. එය අවසන් තීරණය වේ.

වෛද්‍ය කේ. ඩී. ආරියපාල,
සත්ත්ව නිෂ්පාදන හා
සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (රා. ආ.)

2019 ජනවාරි 29 වැනි දින,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

**කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**
**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ තාක්ෂණ නිලධාරි තනතුර සඳහා අයදුම්පත**

| | |
|---|---|
| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය | |

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාල කොටුව තුළ ලියන්න.)

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

01. නම :

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(උදා.) SILVA B. A.)
1.2 සම්පූර්ණ නම සිංහලෙන් :————.

1.3 ජාතික හැඳුනුම්පත් අංකය :

02. (i) ලිපිනය :
පෞද්ගලික :————.
රාජකාරි :————.
ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය :
..........................................................................................
..........................................................................................

(ii) සම්බන්ධ කර ගත හැකි දුරකථන අංක :

ජංගම :————. ස්ථාවර :————.

03. 3.1 ස්ත්‍රී පුරුෂ භාවය (අදළ කොටුව තුළ සලකුණු කරන්න.) :

ස්ත්‍රී
පුරුෂ

3.2 උපන් දිනය :

වර්ෂය මාසය දිනය

3.3 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට වයස :

අවුරුදු මාස දින

3.4 විවාහක අවිවාහක බව (අදළ අංකය කොටුව තුළ සලකුණු කරන්න) :

විවාහක
අවිවාහක

04. අධ්‍යාපන සුදුසුකම් :

4.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :
වර්ෂය :————. මාසය :————.

| විෂය | ලබාගත් සාමාර්ථය | විභාග අංකය |
|---|---|---|
| | | |

4.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය :
වර්ෂය :————. මාසය :————.

| විෂය | ලබාගත් සාමාර්ථය | විභාග අංකය |
|---|---|---|
| | | |

4.3 (අ) වෘත්තීය සුදුසුකම් ලබාගත් ආයතනය :————.
4.3 (ආ) වෘත්තීය සුදුසුකම් ලබාගත් වර්ෂය :————.

05. වර්තමාන රැකියාව හා කලින් දැරූ පත්වීම් (ඇත්නම් පමණක්) :

| තනතුර | ආයතනය | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

06. විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලයේ නම :————.
මුදල් ඇණවුම් අංකය :————.

| |
|---|
| සම්පූර්ණ විභාග ගාස්තුව රු.400 කි. දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකින් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට<br>ගෙවන කාර්යාලය : පේරාදෙණිය<br><br>කුවිතාන්සිය මෙහි අලවන්න. |

07. මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවටත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(දැනට රජයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරින්ට පමණක් අදල වේ.)

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

මෙම දෙපාර්තමේන්තුවේ ............................................ ලෙස සේවය කරන ............................ ................. මයා/මිය/මෙනවිය විසින් සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත් ඒවා නිවැරදි බවත් අපේක්ෂකයා/අපේක්ෂිකාව ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කල හැකි/නොහැකි බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා.
(නිල මුද්‍රාව තැබිය යුතුය)

පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

02-621

---

**සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරි බණ්ඩ - 2 සේවා ගණයේ (MN 05 - 2006 A ) පෝෂණවේදී II ශ්‍රේණියේ තනතුරු සඳහා සීමිත පදනම මත බඳවා ගැනීම - 2018

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ රෝහල් හා ආයතන සඳහා ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරි බණ්ඩ - 02 සේවා ගණයට (MN 05-2006A) අයත් පෝෂණවේදී තනතුරේ II ශ්‍රේණියට සීමිත ධාරාව යටතේ පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය* :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන ලිඛිත විභාගයේ හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵලවල කුසලතා අනුපිළිවෙල මත පවතින පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. (බඳවා ගන්නා නිලධාරීන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව හා අවශ්‍යතාව මත අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත.)

02. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

(i) අධ්‍යාපන සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ආහාර විද්‍යාව හා පෝෂණවේදය පිළිබඳ විශේෂ උපාධිය ලබා තිබීම.
හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යාවේදී උපාධිය පළමු/දෙවන පන්තියේ සාමාර්ථයක් සමග ආහාර විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

(ii) *පළපුරුද්ද* :

සේවය ස්ථිර කර ඇති, පූර්වාසන්න වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සපුරන MN - 04-2006 ඒ වැටුප් කේතය යටතේ වැටුප් ලබන රාජ්‍ය සේවයේ නිලධාරියෙකු වීම.

(iii) *කායික සුදුසුකම්* :
ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

03. *වෙනත්* :
(i) 2019.03.15 දිනට අයදුම්කරුවන් විසින් සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතුය.
(ii) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
(iii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

04. *වයස් සීමාව* : අදාල නොවේ.

05. *ලිඛිත පරීක්ෂණය* :

| ප්‍රශ්න පත්‍රය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය | විෂයය නිර්දේශය |
|---|---|---|---|---|
| විෂයානුබද්ධ පරීක්ෂණය | පැය 02 | 100 | 40% | තනතුරට අදාලව ක්ෂේත්‍රගත සාමාන්‍ය විෂය කරුණු සහ ප්‍රායෝගික යෙදීම් යන කරුණු සම්බන්ධයෙන් හැකියාව මැන බැලීම අපේක්ෂා කෙරේ. |

(ii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙලවරේ ''පෝෂණවේදී (සීමිත) බඳවා ගැනීම සඳහා අයදුම්පත්‍රය'' යනුවෙන් සඳහන් කළ යුතුය.

(iii) මේ පිළිබඳ ඉදිරි ලිපි ගනුදෙනු කටයුතු විද්‍යුත් තැපැල මගින් සිදු කිරීමට ද ඉඩඇත. එමනිසා ඔබගේ භාවිතයේ පවතින විද්‍යුත් තැපැල ලිපිනයක් ලබාදීම අනිවාර්ය වන අතර, ඒ පිළිබඳ අවධානයෙන් සිටිය යුතු වේ.

(iv) විභාග ගාස්තු : විභාග ගාස්තුව රු. 500.00 කි. ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ ''සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්'' නමින් ඇති ගිණුම් අංක : 7041318 ගිණුමට බැරවන පරිදි මෙම මුදල ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා ලබාගත් රිසිට්පත ආදර්ශ අයදුම්පතෙහි ඇති කොටුව තුළ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.)

(v) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවී හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

(vi) මෙම නිවේදනයේ නියමයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) අයදුම්පත් ලද බව දන්වා එවනු නොලැබේ.

(viii) සුදුසුකම් ලැබූවන් විභාගයට කැඳවනු ලබන අතර ඒ බව සති දෙකකට ප්‍රථම අයදුම්පතෙහි සඳහන් ලිපිනයට දැනුම් දෙනු ලැබේ.

*සැලකිය යුතුය* :

- අයදුම්පතේ සෑම වගන්තියක්ම සම්පූර්ණ කර ඇති බව හා එම තොරතුරුවල නිවැරදි බව පිළිබඳ සහතික විය යුතුය.
- ඉහත පරිදි බඳවා ගන්නා ලද සියළුම දෙනා රජයේ සේවකයන්ට අදාළ වන සියළුම නීති රීති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරි බණ්ඩ 2 සේවා ගණයේ (MN05-2006A) බඳවා ගැනීම් පරිපාටියට අයත් විධිවිධාන හා නීති රීති වලටද, සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ මගින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් රෙගුලාසි හා වෙනත් රෙගුලාසි වලටද රජය විසින් වරින් වර පනවනු ලබන නීති රීති හා නියෝගයන්ට යටත් වනු ඇත.
- තනතුර සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම පොදු චක්‍රලේඛයෙන් අනාවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් ගැටළු සහගත තත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත. එසේම මෙම චක්‍රලේඛයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

ගීතාමනී සී. කරුණාරත්න,
*වැ.බ.*/ ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2019 ජනවාරි මස 30 වැනි දින,
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
''සුවසිරිපාය''
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

06. වැටුප් පරිමාණය : 2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ උපලේඛන I අනුව මෙම තනතුරට අදාල මාසික වැටුප් පරිමාණය රු. 34,605-10x660-11x755x15x930-63,460 (MN-05-2016 (ඒ) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

07. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ.

| අනු අංක | ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂය | පරීක්ෂා කර ලකුණු ලබා දෙන ශීර්ෂය | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | අදාළ ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද | රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ඉල්ලුම් කර ඇති තනතුරක විෂය ක්ෂේත්‍රයට අදාලව සේවය කිරීම වෙනුවෙන් එක් වසරකට (01) ලකුණු 05 බැගින් (අවශ්‍ය මූලික පළපුරුදු කාලයට අමතරව) | 40 |
| 02. | අමතර අධ්‍යාපන සුදුසුකම් | මෙම දැන්වීමේ 02.1 අධ්‍යාපන සුදුසුකම්වලට අමතර වශයෙන් වන පහත සුදුසුකම් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ. | |
| | | (I) ආහාර හා පෝෂණය හෝ ආහාර හා තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධියක් වෙනුවෙන් ලකුණු 10ක් බැගින් | 20 |
| | | (II) ක්ෂේත්‍රයට අදාලව පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා ලකුණු 05ක් බැගින්. | 10 |
| 03. | ක්ෂේත්‍රයට අදාල පර්යේෂණ හා ප්‍රකාශන | ක්ෂේත්‍රයට අදාලව (මානව පෝෂණය සම්බන්ධව) ප්‍රසිද්ධ කරන ලද (ග්‍රන්ථ ප්‍රකාශන මණ්ඩලයෙන් අංකයක් ලබාගත්/පිළිගත් ජ'නලයකට පල කරන ලද) පර්යේෂණ හා ප්‍රකාශන එකකට ලකුණු 05 බැගින් ලකුණු ලබා දෙනු ලැබේ. | 25 |
| 04. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | | 05 |
| | මුළු ලකුණු ප්‍රමාණය | | 100 |

08. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි* :

(i) බඳවා ගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති විය යුතුය.
(ii) පත් කරනු ලබන තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.
(iii) අයදුම්පත් තම දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.
(iv) පළපුරුද්ද තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සහතික කළ යුතුය.
(v) මෙම පත්වීම අවුරුදු 01ක වැඩබැලීමේ කාලයකට යටත් ය.
(vi) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට ආනුෂාංගික චක්‍රලේඛ අනුව අදාල මට්ටමේ භාෂා ප්‍රවීනතාව ලබාගත යුතුය.
(vii) ලිඛිත විභාගයේදී අපේක්ෂකයින් ලබා ගන්නා ලකුණුවල කුසලතාඅනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් හෝ අවම වශයෙන් 05 දෙනෙකු යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම කරනු ලැබේ.
(viii) ලිඛිත විභාගය සහ යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණයේ අපේක්ෂකයන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනු පිළිවෙල සලකා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.
(ix) යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදීම සුදුසුකම් පරීක්ෂා කිරීම ද සිදු කරනු ලැබේ.

09. *අයදුම් කළ යුතු ක්‍රමය* :

(I) අයදුම්පත් 2019.03.15 වැනි දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අධ්‍යක්ෂ (පාලන) 07,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
සුවසිරිපාය,
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ආදර්ශ අයදුම් පත්‍රය

**සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ පෝෂණවේදී තනතුර (සීමිත) සඳහා බඳවා ගැනීම**

පදිංචි දිස්ත්‍රික්කය : [ ] විභාගය සඳහා ඉදිරිපත්වන මාධ්‍ය : (සිංහල - S/ඉංග්‍රීසි - E/දෙමළ - T) [ ]

01. (i) මුලකුරු සමග නම (සිංහලෙන්) :————.
(ii) මුලකුරු සමග නම ඉංග්‍රීසි කැපිටල් අකුරින් :————.
(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
(iv) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

02. ස්ථිර පදිංචි ලිපිනය :
(i) සිංහලෙන්/දෙමළෙන් :————.
(ii) ඉංග්‍රීසි කැපිටල් අකුරින් :————.

03. ලිපිනය (රාජකාරි) :
(ලිපිනයෙහි වෙනසක් වේනම් එය වහාම දැන්විය යුතුවේ.) :————.
(iii) සිංහලෙන්/දෙමළෙන් :————.
(iv) ඉංග්‍රීසි කැපිටල් අකුරින් :————.

04. ඊමේල් ලිපිනය :————.

05. දුරකථන අංකය :————.

06. උපන් දිනය : වර්ෂය :————, මාසය :————, දිනය :————.

07. ජාතික හැඳුනුම්පත් අංකය :————.

08. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

09. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු ද යන්න. :————.

10. තමාගේ ස්ථිර පදිංචිය වශයෙන් අපේක්ෂකයා දක්වන දිස්ත්‍රික්කය :————.

11. විවාහක/අවිවාහක බව :————.

12. සුදුසුකම් (නිවේදනයේ 2 ඡේදයට යටත් වන සුදුසුකම්)
අධ්‍යාපන සුදුසුකම් :......................................................................
:......................................................................
......................................................................

වෘත්තීය සුදුසුකම් :......................................................................
......................................................................
......................................................................

පළපුරුද්ද:......................................................................
: ......................................................................

13. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :————.
13.1 විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
13.2 ලදුපත් අංක හා දිනය :————.
13.3 ගෙවූ මුදල :————.

| |
|---|
| ලංකා බැංකු ශාඛාවකට රු. 500.00 ක මුදල ගෙවා ලබාගත් රිසිට්පත නොගැලවෙන සේ මෙහි අලවන්න. |

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

14. දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතු විස්තර. :

(i) නිලධාරියාගේ නම :————. මයා/මිය/මෙනවිය
(ii) නිලධාරියාගේ ජාතික හැඳුනුම්පත් අංක :————.
(iii) විභාගයට අයදුම්කරන අවස්ථාවේදී දැරූ තනතුර :————.
(iv) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අඛණ්ඩ අවුරුදු 05ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද? :————.
(v) තනතුරේ ස්ථිර කරමින් ස්ථිර කිරීමේ ලිපියක් නිකුත් කර තිබේද? එසේ නම් එම ලිපියේ සහතික කරන ලද පිටපතක් අමුණන්න. :————.
(vi) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර වර්ෂ 05ක කාලයේ සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබේද? :————.
එසේනම් එහි ස්වභාවය :————.
(vii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර වර්ෂ 05ක කාලය තුළදී විනයානුකූලව දඬුවමකට යටත් කොට තිබේද?
(ඔව් නම් විස්තරය සපයන්න.)
(viii) දැනට විනයානුකූල පරීක්ෂණ පැවැත්වෙන්නේද ? :————.
(ඔව් නම් විස්තර සපයන්න.)
(ix) උසාවියක් ඉදිරියේ ඔබ කිසියම් චෝදනාවකට වරදකරු වී තිබේද ? :————.
(ඔව් නම් විස්තර සපයන්න.)

15. *අයදුම්කරුගේ සහතිකය* :

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි ඇතුළත් යම් කිසි විස්තරයක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව සොයාගනු ලැබුවහොත් එසේ සොයා ගන්නා ලද්දේ තෝරා ගැනීමට පෙර නම් එම අයදුම්පත අවලංගු වන බවද, තෝරා ගැනිමෙන් පසුව නම් යම් කිසි වන්දියක් නොමැතිව මම සේවයෙන් පහකරනු ලබන බවද පිළිගනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

16. *දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ නිර්දේශය* :

මෙම ඉල්ලුම්කරුවන ...................................... මයා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/පළාත් සභාවේ/ආයතනයේ .................. වැනි දින සිට සේවය කරයි. ඔහු/ඇය ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරයි. පසුගිය වසර ........................ ක කාලය තුළ ඔහු/ඇය වේතනාධික සියල්ල උපයාගෙන ඇති බව ද ඔහු/ඇය මොනයම් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) යටත් කොට නොමැති බව ද ඉහත සඳහන් කර ඇති සියල්ල මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් පරීක්ෂා කර බැලූ බවද ඒවා නිවැරදි බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාග නු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදවා හරින/නොහරින බව ද ........................ දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බව ද සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————.
තනතුර :————.
දිනය :————.
දෙපාර්තමේන්තුව/ආයතනය :————.
(රබර් මුද්‍රාවකින් සනාථ කළ යුතුය.)

02-534

සංශෝධනයයි

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ I ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරීන් සඳහාවන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013 (2019)

2019.02.01 දින පළකරන ලද 2109 දරන *ගැසට් පත්‍රයේ* නිවේදන අංක 02-274/1 නිවේදනයේ සඳහන් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ I ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරීන් සඳහාවන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013(2019) සඳහාවන ආදර්ශ අයදුම් පත්‍රයෙහි ශීර්ෂය සහ 05 වන ඡේදය මෙහි ඇමුණුමෙහි සඳහන් ආකාරයට සංශෝධනය විය යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

ඉංග්‍රීසි භාෂාවෙන් පළකරන ලද අයදුම්පත්‍රය නිවැරදි බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

ආර්. එච්. ටී. එස්. හෙට්ටිආරච්චි,
අධ්‍යක්ෂ (පාලන),
ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් *වෙනුවට.*

**ආදර්ශ අයදුම්පත**

***ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ I ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරීන් සඳහාවන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013 (2019)***

**Second Efficiency Bar Examination for Grade I Statistical Officers in the Department of Census and Statistics 2013(2019)**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDHANA, H. M. S. K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. 2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම සහ ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම සහ ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 පෞද්ගලික ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.4 ජංගම දුරකථන අංකය :

ස්ථාවර දුරකථන අංකය :

03. ජාතික හැඳුනුම්පත් අංකය :

04. ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0 ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ඔබ මෙවර විභාගයේ දී ඉදිරිපත් වන විෂයය/විෂයයන් :

| *අනු. අංකය* | *විෂයය* | *විෂයය අංකය* |
|---|---|---|
| 01. | | |
| 02. | | |

06. උපන් දිනය :

වර්ෂය: මාසය: දිනය:

07. දැනට දරන -
7.1 තනතුර :————.
7.2 පත්වීම් ලිපියේ අංකය :————.

08. 8.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවටද? :————.
8.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේනම් ගෙවන ලද විභාග ගාස්තුව :————.
8.3 ලදුපත් අංකය :————.
8.4 දිනය :————.

*ලදුපත මෙහි අලවන්න. ( අදාළ නම් පමණි)*
*(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)*

09. *අයදුම්කරුගේ ප්‍රකාශය :*
ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, විභාග ගාස්තුව රුපියල් ………… ගෙවා ලබා ගත් ලදුපත මෙහි අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*සටහන* - තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ය.

10. *අත්සන සහතික කිරීම :*
මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරියකු/නිලධාරිනියක සහ පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන …………………… මයා./මිය./මෙනවිය ………… දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ලබා ගත් ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

නම :————;
පදවි නාමය :————;
ලිපිනය :————;
දිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

11. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*
1.ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
2. නිලධාරියා/නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
සහ නිල මුද්‍රාව.

නම :————;
පදවි නාමය :————;
ලිපිනය :————;
දිනය :————.

02-677

---

**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ III වන ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018 (2019)**

ඉහත සඳහන් තරග විභාගයට අයදුම්පත් කැඳවීමේ නිවේදනය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2110 හා 2019.02.08 වැනි දින දරන *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කර ඇත.

02. එකී දෙමළ මාධ්‍යය නිවේදනයේ 4 ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් දන්වමි.

04. බඳවා ගැනීමේ සුදුසුකම් :
උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා පහත සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(අ) (i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.
(ii) අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත වීම.
(iii) උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයට බඳවා ගනු ලබන සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

(ආ) ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දී තිබීම.

හෝ

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කෙරෙන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන උපාධියක් ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලෙස අධිකරණ සේවා කොමිෂන් සභාව පිළිගනු ලබන සුදුසුකමක් ලබා තිබීම.

**සටහන** .- ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දී ඇති දිනය හෝ උපාධිය බලපවත්නා දිනය අයදුම්පත් කැඳවන අවසන් දිනට හෝ එදිනට පෙර දිනයක් විය යුතුය.

(ඈ) වයස - අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 22 ට නො අඩු හා අවුරුදු 45 ට නො වැඩි විය යුතුය.
''ඒ අනුව 1997.02.08 දිනට හෝ ඊට පෙර හා 1974.02.08 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.''

(දැනටමත් රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ සහ උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ නිරත නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

*සැ. යු.*- සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් *ගැසට් පත්‍රයේ* දිනය වන 2019 පෙබරවාරි මස 08 වැනි දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවර්ය වේ.

03. ඉහත ගැසට් නිවේදනයේ අනෙකුත් කොන්දේසි සියල්ලම එලෙසින්ම පවතී.

එච්. එස්. සෝමරත්න,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2019 පෙබරවාරි මස 11 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

02-878

---

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## බඩු බාහිරාදිය විකිණීම්

මගේ අංකය : වල/දිසා/මහෙ/අධි/වෙන්දේසි 02.

**රාජසන්තක කරනු ලබන භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

උක්ත කරුණට අදාළව 2019.01.18 දිනැති අංක 2017 දරන ගැසට් නිවේදනයට අනුව 2019.02.09 දින පැවැත්වීමට නියමිතව තිබූ භාණ්ඩ වෙන්දේසිය එදින නොපැවැත්වෙන බැවින්, එය එකී දැන්වීමේ සඳහන් නියමයන්ට යටත් ව 2019.03.02 දින පෙ. ව 9.30 ට මෙම අධිකරණ භූමියේ දී පැවැත්වෙන බවත්, මෙයින් දැනුම් දෙනු ලැබේ.

ටී. ආර්. එස්. ජිනදාස,
දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්,
වලපනේ.

2019 ජනවාරි මස 28 වැනි දින,
වලපනේ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

02-488

---

**සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය - මනම්පිටිය**

නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මනම්පිටිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද හිමිකම් නොකියන ලද භාණ්ඩ හා නඩු අංක සොයාගත නොහැකි වූ කල්තබා ගැනීමේ දී විනාශ වී යා හැකි භාණ්ඩ 2019.03.10 වැනි දින පෙ. ව. 9.30 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙහි සඳහන්වන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසිය පවත්වන දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳ සලකා බැලීම සඳහා අදාළ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2කට පෙර වෙන්දේසියේ නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසු මුදල නොපිළිගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර දැමීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ මිළ දී ගනු ලබන භාණ්ඩ සඳහා මුදල් ගෙවීමේ දී ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් පමණක් ගෙවීම් සිදුකළ යුතු අතර චෙක්පත්, බැංකු අණකර කිසිවක් භාරගනු නොලැබේ.
06. භාණ්ඩ මිළදී ගැනීමේ දී තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

07. වෙන්දේසියෙන් මිළ දී ගන්නා ලද භාණ්ඩ වෙන්දේසිය පවත්වන දිනයේ දී ප. ව. 5.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

08. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම් , වෙන්දේසිය පවත්වන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

හර්ෂණ ධනුෂ්ක රත්නායක,
දිසා විනිසුරු/ මහෙස්ත්‍රාත්,
දිසා මහෙස්ත්‍රාත් අධිකරණය,
පොළොන්නරුව.

2019 ජනවාරි මස 17 වැනි දින,
පොළොන්නරුව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 1. | 27669 | වතුර මෝටර් 01 |
| 2. | AR 1492/16 | උදැල්ල 01 |
| 3. | 8692 | උදැල්ල 01 |
| 4. | 946 | පොල් උලක් |
| 5. | 3732 | සවල් 01 |
| 6. | 28043 | සවල් 01 |
| 7. | 28041 | සවල් 01 |
| 8. | 15054 | සවල් 01 |
| 9. | 28042 | සවල් 01 |
| 10. | 18842 | සවල් 03 |
| 11. | 23957 | සවල් 01 |
| 12. | 18484 | සවල් 01 |
| 13. | 3732 | සවල් 01 |
| 14. | 11026 | සවල් 01 |
| 15. | 15425 | සවල් 01 |
| 16. | 20261 | සවල් 01 |
| 17. | අංක රහිත | සවල් 01 |
| 18. | AR 1576/16 | අලවංගු 01 |
| 19. | PR 115/18 | උදැල්ල 01 |
| 20. | 15056 | සවල් 01 |
| 21. | 80082 | ජංගම දුරකථන |
| 22. | 28577 | අත් කියත් 01 |
| 23. | 28578 | අත් කියත් 01 |
| 24. | 31838 | අත් කියත් 01, නියන් 01, ටේප් පටි 01 |
| 25. | 91547 | ට්‍රැක්ටර් ට්‍රේලරය |
| 26. | අංක රහිත | බූලි තොගය, බැරල් තොගය, බෝතල් තොගය |

02-221

---

**සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය - රක්වාන**

අධිකරණය මගින් රාජසන්තක කරනු ලැබූ ද්‍රව්‍ය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

රක්වාන මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2019.03.02 වැනි දින පෙ. ව. 10.30 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳ හිමිකම් පාන්නෙක් වේ නම්, වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. වෙන්දේසිය පැවැත්වීමට පැය භාගයකට පෙර රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත අදාළ භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවක, අදාළ භාණ්ඩය වෙන්දේසියෙන් ඉවත් කිරීමට අධිකරණයට බලය ඇත.

05. මිලදී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

06. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් ආදිය භාර නොගැනේ.

07. ගැණුම්කරුවන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

ඒ. එන්. රසංජලා පෙරේරා,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
පැල්මඩුල්ල.

2019 ජනවාරි මස 24 වැනි දින,
පැල්මඩුල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසි කිරීමට නියමිත නඩු භාණ්ඩ**

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - රක්වාන**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | 80677 | උදලු 01යි |
| 02. | 80698 | ඇදුම් උදලු 01යි |
| 03. | 80676 | ලොකු කුඩා වට්ටි 02යි |
| 04. | 80675 | අලවංගු 01යි |
| 05. | AR. 1026/17 | ඇදුම් උදලු 02යි, වේවැල් කුඩ 06යි, ගැරුම් වට්ටි 01යි, උදලු 01යි, කැට කුඩ 01යි, යකඩ බාල්දි 01යි |
| 06. | 78401 | ගැරුම් වට්ටි 01යි, ඉල්ලම් කුඩ 02යි, යකඩ ඉනි 01යි, දැල් කුඩ 01යි, උදලු 01යි |
| 07. | 80178 සහිත | ඇලුමිනියම් මුට්ටි 01යි, ඇලුමිනියම් කල 01යි, ගෑස් සිලින්ඩර් 01යි, රෙගියුලේටරය ගෑස් ලිප් 01යි |
| 08. | 77880 | ගෑස් සිලින්ඩර් 01යි, රෙගියුලේටරය සහිත ගෑස් ලිප් 01යි |
| 09. | 65886 | ඇලුමිනියම් මුට්ටි 01යි |
| 10. | 78192 | උදලු 01යි |
| 11. | AR. 770/17 | ඇදුම් උදලු 02යි, වේවැල් කුඩ 01යි |
| 12. | 76633 | ගෑස් සිලින්ඩර් 01යි. කරාම 04කින් යුත් ගෑස් ලිප් 01යි |
| 13. | 76918 | ඇලුමිනියම් කල 01යි |
| 14. | 80853 | උදලු 01යි |
| 15. | 80851 | වේවැල් කුඩ 01යි |
| 16. | 80660 | බ්‍රවුන් සී ෆැන් වර්ගයේ අත් ට්‍රැක්ටර් 01යි, බෙල්ට් 02යි, හැඬල් 01යි, (කැබලිකර විකිණීමට) |
| 17. | 77119 | සී ෆැන් වර්ගයේ අත් ට්‍රැක්ටරය, බෙල්ට් 02යි, පණ ගන්වන හැඩලය (කැබලිකර විකිණීමට) |
| 18. | 24219 | අංක 130-0286 දරන JIALING වර්ගයේ යතුරු පැදි 01යි. (කැබලිකර විකිණීමට) |
| 19. | 77345 | යන්මාර් වර්ගයේ අංක රහිත එන්ජිම හා පන ගන්වන හැඬලය, බෙල්ට් 02යි (කැබලි කර විකිණීමට) |
| 20. | 57739 | KUKJE/KT - 8 වර්ගයේ අත් ට්‍රැක්ටර් 01යි, රෝද දෙක සහිත ට්‍රේලරය (කැබලි කර විකිණීමට) අත් පොරව 01යි |
| 21. | | වීදුරු බෝතල් 150 යි |
| 22. | | ප්ලාස්ටික් ගැලුම් 50 යි |

02-489

**මහෙස්ත්‍රාත් අධිකරණය - මාරවිල**

මෙම අධිකරණයේ පැවති නඩුවලට අදාළව රාජසන්තක කරන ලද අයිතිවාසිකම් නොකියන ලද පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2019.03.16 වැනි දින පෙරවරු 10.00 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

02. උපලේඛනයේ සඳහන්වන කිසියම් භාණ්ඩයක් පිළිබඳ හිමිකම් දක්වන යම් තැනැත්තෙක් සිටී නම්, වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින පෙරවරු 9.45 ට පෙර ස්වකීය හිමිකම් තහවුරු කල යුතු ය.

03. වෙන්දේසිය පැවැත්වෙන දින පෙරවරු 8.30 සිට 9.30 දක්වා මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගෙන් අවසරය ලබාගෙන භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසි භාණ්ඩ මිලදී ගන්නා තැනැත්තන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

06. වෙන්දේසියේ දී මිලදී ගන්නා භාණ්ඩ සඳහා එම අවස්ථාවේ දී ම මුදලින් පමණක් ගෙවීම් කළ යුතු ය.

07. වෙන්දේසියේ දී මිල දී ගන්නා භාණ්ඩ එදින පස්වරු 3.30 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කළ යුතු ය.

දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
මාරවිල.

2019 ජනවාරි මස 29 වැනි දින,
මාරවිල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

උපලේඛනය

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩය* | *වර්ගය හා චැසි අංකය* |
|---|---|---|---|
| 01. | 50162/C | ලොරි 28-5089 | TLD24 - 9866642 |
| 02. | 48640/C | 43 - 4178 | BU 64 - 0009801 |
| 03. | 89227/C | 28 - 5421 | T210F - 85431 |
| 04. | 41/D | 41 - 8505 | TLD23 - 0268471 |
| 05. | 70512/C | GA - 8222 | NKR66E - 7472914 |
| 06. | 40888/C | 48 - 8908 | NKR66E - 7117621 |
| 07. | 92134/C | PN - 3008 | MAIF A2HRRD6F23257 |
| 08. | 2914/D | ලොරි LE - 2982 | DA63T - 178839 |
| 09. | 70879/C | HJ - 8743 | SE88T - 204934 |
| 10. | 94747/C | ත්‍රී රෝද YL - 7409 | MD2AAAAZZUWA00116 |
| 11. | නඩු අංක රහිත | QD - 7732 | Corroded |
| 12. | නඩු අංක රහිත | QR - 4393 | MB2AAAAZZRWH51833 |
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකතන අංක : 081-2210595/ 071-8446374/071-4962449.

02-553

---

**පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දක්වෙන දේපළ වර්ෂ 2019 ක් වූ මාර්තු මස 7 වැනි දින පෙරවරු 10.00 ට එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, වරකාපොල ප්‍රාදේශීය සභා සීමාවේ වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඹේපුස්ස අංක 83 ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අඹේපුස්සේ පිහිටි රත්මල් ගහ කොටුවේ වත්ත/උළගල් වත්ත/කන්දේවත්ත, නුගහේන වත්ත/අංගොඩ කන්දේ වත්ත/අංගොඩ කන්ද/ගල් අමුණේ වත්ත/ඉදි පදුරේ වත්ත සහ ගල් අමුණේ හේන නමැති ඉඩම මැන බලයලත් මිනින්දෝරු ආර්. එම්. ඒ. කේ. වීරසිංහ විසින් සම්පාදිත 2015.08.30 දිනැති අංක 2830 දරන පිඹුරේ ලොට් 1 යනුවෙන් දක්වෙන ඉඩම සහ එහි පිහිටි වරිපනම් අංක 289 දරන ගොඩනැගිල්ල වැවිලි, වැඩිදියුණු කිරීම් ආදි සියලු දෙය වේ.

විශාලත්වය අ. 01, රූ. 02, පර්. 0

ගම්පොළ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. වෑගොඩපොළ විසින් සහතික කරන ලද වර්ෂ 2015.09.04 දිනැති අංක 1551, වර්ෂ 2015.09.22 දිනැති අංක 1567 වර්ෂ 2016.06.30 දිනැති අංක 1854 වර්ෂ 2017.05.24 දිනැති අංක 2246 සහ වර්ෂ 2017.12.26 දිනැති අංක 2384 දරන උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම එෆ්. එම්. මිරර් ඉන්ඩස්ට්‍රීස් ඒක පුද්ගල ව්‍යාපාරයේ හිමිකරු වන දස්තකීර් මොහොමඩ් යහිය යන අය විසින් ''බන්ධනදයි/උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතීන් පිළිබඳ නිවේදනයන් සඳහා. - වර්ෂ 2019 ජනවාරි මස 11 වැනි දිනැති රජයේ ගැසට් පත්‍රයද, වර්ෂ 2019 ජනවාරි මස 03 වැනි දිනැති දිවයින, දි අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත් පත් ද බලන්න.

ඉහත කී දේපළට පිවිසෙන මාර්ගය.- කොළඹ - මහනුවර මහා මාර්ගයේ අඹේපුස්ස හන්දියේ සිට කොළඹ දෙසට කිලෝ මීටර් 0.9 ක් පමණ ගොස් අංක 59/4 බෝක්කුව පසු වූ වහාම දකුණු පසින් වරකාපොල නුවර පාරේ, වරිපනම් අංක 289 දරන විෂයගත දේපළ පාරට මුහුණලා පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය. - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් වියදම්, මුදලින් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැනුම් මුදලෙන් 10%ක් ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5% ක්ද (සියයට දෙක හමාරක්),
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද (රු. 3,000).

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. එකී 90% ක ඉතිරි මුදල දින 30ක් ඇතුළත දීන නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු සඳහා කළමණාකරු - ණය අය කිරීම් අංශය, පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාළු පාර, කොළඹ 03.

දුරකථන අංක 011 4667218/011 4667229.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
බලයලත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
මාවිල්මඩ, මහනුවර.
දුරකතන අංක 081 2210595, 0718446374.

02-608

---

LE/RE/208.

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව**
**(HDFC බැංකුව)**

(කලින් කළ සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පැරණි ණය අංකය (එහි නව ණය අංකය) : 2503200046 (402550000026).
ණයකරුගේ සම්පූර්ණ නම : වෙද රාල්ලාගේ සරත් වීරසිරි.

(මෙහි මින් මතු ''බැංකුව'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 සහ 2011 අංක 45 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2018.12.28 වැනි දින අංක 2104 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2018.12.14 වැනි දින ''ලංකාදීප'', ''තිනක්කුරල්'' සහ ''ද අයිලන්ඩ්'' යන පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 134 බැද්දගාන පාර, කෝට්ටේ ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති විසින් 2019.03.12 වැනි දින පෙ. ව. 11.00 සිට පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

අංක 1567 දරන උකස් බැඳුම්කරය යටතේ රුපියල් පනස්එක් ලක්ෂ හැත්තෑඅට දහස් හාරසිය පනස් දෙකයි ශත අසූහය (රු. 5,178,452.86) ක මුදලක් වර්ෂ 2018.10.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(01) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හතළිස්හත් ලක්ෂ හැටහය දහස් හත්සිය හැට හයයි ශත අනූ දෙකක (රු. 4,766,766.92) මුදල ද වර්ෂ 2018.10.31 වැනි දින දක්වා හිඟ මුදල වශයෙන් රුපියල් හාර ලක්ෂ එකොළොස් දහස් හයසිය අසූ පහයි ශත අනූ හතර (රු. 411,685.94)ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් පනස් එක් ලක්ෂ හැත්තෑ අට දහස් හාරසිය පනස් දෙකයි ශත අසූ හය (රු. 5,178,452.86) ක මුදල අයකර ගැනීම සඳහා ද,

(02) එකී ණය මුදලෙහි ආපසු නොගෙවූ මුදල වන රුපියල් හතළිස් හත් ලක්ෂ හැටහය දහස් හත්සිය හැට හයයි ශත අනූ දෙකක (රු. 4,766,766.92) මුදල මත 2018.11.01 වැනි දින සිට 2019.11.01 වැනි දින දක්වා පාවෙන පොළී අනුපාතිකය යටතේ 15.50%ක පොළිය සහ 2019.11.01 වැනි දින සිට වාර්ෂිකව සංශෝධනය විය හැකි පාවෙන පොළී අනුපාතිකයක් යටතේ දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා ඊට අදාළ පොළිය අයකර ගැනීම සඳහා ද,

(03) එකී රුපියල් හාර ලක්ෂ පන් දහස් නවසිය අසූ පහයි ශත අනූ හතර (රු. 405,985.94) ක මුදල මත අය විය යුතු මාසිකව 2.00% ක ප්‍රමාද පොළියක් 2018.11.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සිදු කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(04) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම සඳහා ද වේ.

පැරණි ණය අංකය (එහි නව ණය අංකය) : 2503200046 (402550000026)

## උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කිණිගොඩ කෝරළේ, දෙයාල දහමුණ පත්තුවේ, කෑගල්ල ප්‍රාදේශීය සභා සීමාවේ සහ කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, අංක 14 - කරඬුපොත දරන ග්‍රාම නිලධාරි වසමේ කරඬුපොත ග්‍රාමයෙහි පිහිටි කොළඹ නුවර පාරේ තක්සේරු අංක S 32 සහ 34 දරන බෝමළුවේ වත්තේ "ඒ" අක්ෂරය දරන කොටස සහ පිලඋණුමුවේ වත්තේ "ඒ" සහ "සී" අක්ෂය දරන කොටස් ඒකාබද්ධ කරන ලද (එනමුත් ලියාපදිංචි කර ඇති පරිදි බෝමළුවේ වත්ත නමැති) ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. සී. පී. ගුණසේන මහතා විසින් මැන සම්පාදිත අංක 2012/1 දරන 2010.11.22 දිනැති පිඹුරේ සඳහන් කැබලි අංක 02 නමැති ඉඩම සඳහා 2014.08.16 වැනි දින එකී බලයලත් මිනින්දෝරු ඒ. සී. පී. ගුණසේන මහතා විසින්ම නැවත මැන සම්පාදිත අංක 2012/1 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 01 නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : බලයලත් මිනින්දෝරු ටී. ඒ. කාදර් විසින් මැන සම්පාදිත පිඹුරු අංක 1070හි කැබලි අංක 01 වෙන්වන ඉවුර සහ බලයලත් මිනින්දෝරු ඒ. සී. පී. ගුණසේන විසින් මැන සම්පාදිත පිඹුරු අංක 2012හි කැබලි අංක 02හි කොටසක් හා කැබලි අංක 03 ද, නැගෙනහිරට : පිඹුරු අංක 2012හි කැබලි අංක 02හි කොටසක් හා පිඹුරු අංක 2012හි කැබලි අංක 03 වෙන්වන සිමෙන්ති බැම්ම ද, දකුණට : පිඹුරු අංක 2012හි කැබලි අංක 01 වෙන්වන තාප්පය සහ කොළඹ - මහනුවර ප්‍රධාන මාර්ගය ද සහ බටහිරට : පිඹුරු අංක 2012හි කැබලි අංක 01 වෙන් වන තාප්පය ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවයි දශම හතරයි හතරයි හතක (අ. 0, රූ. 0, පර්. 15.447 හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි හතරයි එකයි නවයක (හෙක්. 0.0419) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේ ද සමග කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 195/126හි ලියාපදිංචි කර ඇත.

කෑගල්ල ප්‍රසිද්ධ නොතාරිස් යූ. අයි. හෙට්ටිආරච්චි විසින් 2016.07.27 වැනි දින ලියා සහතික කරන ලද අංක 1567 දරන උකස්කරය අනුව මෙහි දක්වා ඇති උපලේඛනය පරීක්ෂා කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වැ. බ. සාමාන්‍යාධිකාරී.

2019 ජනවාරි මස 30 වැනි දින,
ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව,
ජාතික නිවාස සංවර්ධන අධිකාරි ගොඩනැගිල්ල,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත,
තැ.පෙ. 2085,
කොළඹ 02.

02-580

---

LE/RE/208

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (HDFC බැංකුව)

(කලින් කළ සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ණය අංකය : 702725000085
ණයකරුගේ සම්පූර්ණ නම : ගමඇතිගේ දිමුත් සංජීව

(මෙහි මින් මතු ''බැංකුව යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 සහ 2011 අංක 45 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2018.12.28 වැනි දින අංක 2104 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2018.12.21 වැනි දින ''ලංකාදීප'', සහ ''තිනක්කුරල්'' පුවත්පත්වල සහ 2018.12.22 වැනි දින ''ද අයිලන්ඩ්'' යන පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 134 බැද්දගාන පාර, කෝට්ටේ ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති විසින් 2019.03.08 වැනි දින පෙ. ව. 11.30 සිට පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ල බන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

අංක 2982 දරන උකස් බැඳුම්කරය යටතේ රුපියල් පනස්හතර ලක්ෂ හැත්තෑතුන් දහස් හාරසිය විස්සයි ශත හැටහය (රු. 5,473,420.66) ක මුදලක් වර්ෂ 2018.09.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(01) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හතළිස්හය ලක්ෂ පනස් නව දහස් හයසිය අනූ එකයි ශත පනස් හතරක (රු. 4,659,691.54) මුදල ද වර්ෂ 2018.09.30 වැනි දින දක්වා හිඟ මුදල වශයෙන් රුපියල් අට ලක්ෂ දහතුන් දහස් හත්සිය විසිනවයයි ශත දොළහ (රු. 813,729.12) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් පනස් හතර ලක්ෂ හැත්තෑ තුන් දහස් හාරසිය විස්සයි ශත හැට හය (රු. 5,473,420.66) ක මුදල අයකර ගැනීම සඳහා ද,

(02) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ මුදලවන රුපියල් හතළිස් හය ලක්ෂ පනස්නව දහස් හයසිය අනූ එකයි ශත පනස් හතර (රු. 4,659,691.54) ක මුදල මත අයවිය යුතු වර්ෂයකට 17.50%ක් බැගින් වූ පොළිය 2018.10.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(03) එකී රුපියල් හත් ලක්ෂ අනූ නව දහස් හත්සිය විසි නවයයි ශත දොළහක (රු. 799,729.12) මුදල මත අය විය යුතු මාසිකව 2.00% ක ප්‍රමාද පොළියක් 2018.10.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සිදු කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(04) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු අයකර ගැනීම සඳහා ද වේ.

## උපලේඛනය

උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, සිංහල පත්තුවේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවේ, අංක 74 - හිඟුරක්ගොඩ දරන ග්‍රාම නිලධාරි වසමේ හිඟුරක්දමන ග්‍රාමයෙහි පිහිටි සර්වේ ජනරාල් විසින් සාදනු ලැබ ඔහු භාරයේ ඇති අංක F.C.P.PO. 132 පිඹුර ප්‍රකාර කැබලි අංක 596 2/3 නමැති ගොඩ ඉඩම් කොටසට මායිම්, උතුරට : කැබලි අංක 569 1/3 ද, නැගෙනහිරට, දකුණට සහ බටහිරට : කැබලි අංක 596 3/3 ද, යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි අටයි හතරයි අටක (හෙක් 0.0848) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදි සියලු දේ ද සමග වේ.

ඉහත සඳහන් සීමා මායිම් තුළ, හිඟුරක්ගොඩ ග්‍රාමයෙහි පිහිටි එකී ඉඩමට බලයලත් මිනින්දෝරු පී. බී. ඉලංගසිංහ විසින් නැවත මැන සම්පාදිත 2007.12.29 දිනැති අංක 2008/PO/41 දරන පිඹුර ප්‍රකාර හිඟුරක්දමන ලෙස සඳහන් ඉඩමෙහි කැබලි අංක 01 නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : පාර ද, දකුණට : තාප්පයෙන් වෙනවන පිඹුරු අංක F.C.P.PO. 132හි කැබලි අංක 596 3/3 ද සහ බටහිරට : තාප්පයෙන් වෙන් වන පිඹුරු අංක F.C.P.PO. 132හි කැබලි අංක 596 3/3 ද යන මායිම් තුළ පිහිටි පර්චස් තිස්තුනයි දශම පහයි තුනක (අ. 0, රූ. 0, පර්. 33.53) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි අටයි හතරයි අටක (හෙක්. 0.0848) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ හා පළතුරු ආදී සියලු දේ ද සමග පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 6/37හි ලියාපදිංචි කර ඇත.

පොළොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් එල්. එච්. ලලිත් මර්වින් ද සිල්වා විසින් 2017.09.28 වැනි දින ලියා සහතික කරන ලද අංක 2982 දරන උකස්කරය අනුව මෙහි දක්වා ඇති උපලේඛනය පරීක්ෂා කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වැ. බ. සාමාන්‍යාධිකාරී.

2019 ජනවාරි මස 30 වැනි දින,
ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව,
ජාතික නිවාස සංවර්ධන අධිකාරි ගොඩනැගිල්ල,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත,
තැ.පෙ. 2085,
කොළඹ 02.

02-582

---

LE/RE/208

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (HDFC බැංකුව)

(කලින් කළ සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පැරණි ණය අංකය (එහි නව ණය අංකය) : 0807200015 (303725000004)
ණයකරුගේ සම්පූර්ණ නම : මංජුල නිශේන්ද්‍ර ගුණසීල ජයවර්ධන

(මෙහි මින් මතු ''බැංකුව'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 සහ 2011 අංක 45 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2018.12.28 වැනි දින අංක 2104 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2018.12.14 වැනි දින ''ලංකාදීප'', ''තිනක්කුරල්'' සහ ''ද අයිලන්ඩ්'' යන පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 134 බැද්දගාන පාර, කෝට්ටේ ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති විසින් 2019.03.05 වැනි දින පෙ. ව. 11.00 සිට පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

අංක 264 දරන උකස් බැඳුම්කරය යටතේ රුපියල් පනස්තුන් ලක්ෂ තිස්නව දහස් හත්සිය විසිදෙකයි ශත හැටනවය (රු. 5,339,722.69) ක මුදලක් වර්ෂ 2018.09.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(01) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් විසිහය ලක්ෂ අනූ අට දහස් එකසිය හතරයි ශත අසූඑකක (රු. 2,698,104.81) මුදල ද වර්ෂ 2018.09.30 වැනි දින දක්වා හිඟ මුදල වශයෙන් රුපියල් විසිහය ලක්ෂ හතළිස් එක් දහස් හයසිය දාහතයි ශත අසූ අටක් (රු. 2,641,617.88) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් පනස්තුන් ලක්ෂ තිස්නව දහස් හත්සිය විසි දෙකයි ශත හැට නවයක් (රු. 5,339,722.69) ක මුදල අයකර ගැනීම සඳහා ද,

(02) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ මුදල වන රුපියල් විසිහය ලක්ෂ අනූ අට දහස් එකසිය හතරයි ශත අසූඑකක (රු. 2,698,104.81) මුදල මත අයවිය යුතු වර්ෂයකට 18.00% බැගින් වූ පොළිය 2018.10.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(03) එකී රුපියල් විසිතුන් ලක්ෂ අනූ හතර දහස් එකසිය අනූ අටයි ශත හැට හතරක (රු. 2,394,198.64) මුදල මත අයවිය යුතු මාසිකව 2.00% ක ප්‍රමාද පොළියක් 2018.10.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේයේ විකිණීම සිදු කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(04) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු අයකර ගැනීම සඳහා ද වේ.

පැරණි ණය අංකය (එහි නව ණය අංකය) 0807200015 (303725000004)

## උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කොරළේ, වැලිගම ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 380 - මිදිගම නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ මිදිගම ග්‍රාමයෙහි පිහිටි උස්බණ්ඩරවත්ත නමැති ඉඩමේ බෙදා වෙන් කළ "සී" අක්ෂරය දරන ඉඩමට 2001.01.07 වැනි දින බලයලත් මිනින්දෝරු එච්. ජී. විමලරත්න මහතා විසින් මැන සම්පාදිත අංක 555 පිඹුර ප්‍රකාර කැබලි අංක 5 නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : මුල් ඉඩමේ "බී" අක්ෂරය දරන කැබැල්ල ද, නැගෙනහිරට : මෙම ඉඩමේ කැබලි අංක 6 ද, දකුණට : මෙම ඉඩමේ කැබලි අංක 10 දරන අඩි 15ක් පළල පාර ද සහ බටහිරට : මෙම ඉඩමේ කැබලි අංක 4 ද යන මායිම් තුළ පිහිටි පර්චස් එකොළහයි දශම පහක (අ. 0, රූ. 0, පර්. 11.5) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි දෙකයි නවයයි එකක (හෙක්. 0.0291) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේ ද සහ මෙම පිඹුරේම කැබලි අංක 10 (අඩි 15ක් පළල පාර) මතින් මාර්ග පරවශ්‍යතා අයිතිය ද සමග මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක P 149/59හි ලියාපදිංචි කර ඇත.

මාතර ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. ආර්. ටී. නානායක්කාර විසින් 2015.04.17 වැනි දින ලියා සහතික කරන ලද අංක 264 දරන උකස්කරය අනුව මෙහි දක්වා ඇති උපලේඛනය පරීක්ෂා කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වැ. බ. සාමාන්‍යාධිකාරී.

2019 ජනවාරි මස 30 වැනි දින,
ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව,
ජාතික නිවාස සංවර්ධන අධිකාරි ගොඩනැගිල්ල,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත,
තැ.පෙ. 2085,
කොළඹ 02.

02-583

---

LE/RE/208

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (HDFC බැංකුව)

(කලින් කළ සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ණය අංකය : 702725000080
ණයකරුගේ සම්පූර්ණ නම : පල්ලේ හිත්තර ගෙදර හේරත්හාමි සහ පල්ලේ හිත්තර ගෙදර රුවන් ඉන්දික

(මෙහි මින් මතු ''බැංකුව යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 සහ 2011 අංක 45 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2018.12.28 වැනි දින අංක 2104 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2018.12.24 වැනි දින ''ලංකාදීප'', ''තිනක්කුරල්'' සහ ''ද අයිලන්ඩ්'' යන පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 134 බැද්දගාන පාර, කෝට්ටේ ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති විසින් 2019.03.08 වැනි දින ප. ව. 2.30 සිට පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

අංක 3330 දරන උකස් බැදුම්කරය යටතේ රුපියල් අසූහත් ලක්ෂ විසිඑක් දහස් නවසිය අසූවයි ශත පනස්නවය (රු. 8,721,980.59) මුදලක් වර්ෂ 2018.09.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(01) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැත්තෑ එක් ලක්ෂ අනූපන් දහස් තුන්සිය අනූහතයි ශත හැට නවයක (රු. 7,195,397.69) මුදල ද වර්ෂ 2018.09.30 වැනි දින දක්වා හිඟ මුදල වශයෙන් රුපියල් පහළොස් ලක්ෂ විසිහය දහස් පන්සිය අසූ දෙකයි ශත අනූවක් (රු. 1,526,582.90)ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් අසූහත් ලක්ෂ විසිඑක් දහස් නවසිය අසූවයි ශත පනස් නවයක් (රු. 8,721,980.59) ක මුදල අයකර ගැනීම සඳහා ද,

(02) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ මුදල වන රුපියල් හැත්තෑ එක් ලක්ෂ අනූපන් දහස් තුන්සිය අනූහතයි ශත හැට නවයක (රු. 7,195,397.69) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17.50%ක් බැගින් වූ පොළිය 2018.10.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(03) එකී රුපියල් පහළොස් ලක්ෂ දාහත් දහස් දෙසිය අසූදෙකයි ශත අනූවක (රු. 1,517,282.90) මුදල මත අය විය යුතු මාසිකව 2.00% ක ප්‍රමාද පොළියක් 2018.10.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සිදු කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(04) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු අයකර ගැනීම සඳහා ද වේ.

## පළමුවන උපලේඛනය

උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, සිංහල පත්තුවේ, ඇලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඇලහැර ප්‍රාදේශීය සභා සීමාවේ, අංක 26-දියබෙදුම දරන ග්‍රාම නිලධාරි වසමේ ඇලිකිඹුලාව ග්‍රාමයෙහි පිහිටි සර්වේ ජනරාල් විසින් සාදනු ලැබූ ඔහු භාරයේ ඇති අංක T.P.P. 25/48 පිඹුර ප්‍රකාර කැබලි අංක 2858 නමැති ගොඩ ඉඩම් කොටසට මායිම්, උතුරට : කැබලි අංක 2814 2/2 සහ 2859 ද, නැගෙනහිරට : කැබලි අංක 2859 සහ 2940 ද, දකුණට : කැබලි

අංක 2866 ද සහ බටහිරට : කැබලි අංක 2940 සහ 2857 ද යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර් බිංදුවයි දශම දෙකයි එකයි හයක (හෙක්. 0.216) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේ ද සමග වේ.

ඉහත සඳහන් සීමා මායිම් තුළ, ඇලිකිඹුලාව ග්‍රාමයෙහි පිහිටි එකී ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. ප්‍රේමරත්න විසින් මෑතකදී මැන සම්පාදිත 2013.11.02 දිනැති අංක 13/W/608 දරන පිඹුර ප්‍රකාර ඇලිකිඹුලාව ලෙස සඳහන් ඉඩමෙහි කැබලි අංක 01 නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : පිඹුරු අංක F.T.P. 25හි කැබලි අංක 2814/2/2 සහ 2859 ද, නැගෙනහිරට : පිඹුරු අංක F.T.P. 25හි කැබලි අංක 2859 සහ 2940 ද, දකුණට : පිඹුරු අංක F.T.P. 25හි කැබලි අංක 2866 ද සහ බටහිරට : පිඹුරු අංක F.T.P. 25හි කැබලි අංක 2940 සහ 2857 ද යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් පහයි දශම හතරක (අ. 0, රූ. 02, පර්. 5.4) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම දෙකයි එකයි හයක (හෙක්. 0.216) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේ ද සමග පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO/E 29/34 හි ලියාපදිංචි කර ඇත.

මෙම ඉඩම අංක පො/ජී/ඉහ/ප්‍ර/ගො/3253 දරන ප්‍රදාන පත්‍රයේ සඳහන් (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ විධිවිධානවලට සහ රක්ෂිත වගන්ති හා කොන්දෙසිවලට යටත්ව බැංකුවට උකස් කිරීම සඳහා, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මොරගහකන්ද, කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකරු (ඉඩම්) විසින් පූර්ව අනුමැතිය ඔහුගේ යොමු අංක RPM/G/L/AT/08-VII දරන 2017.04.03 දිනැති ලිපියෙන් ප්‍රදානය කර ඇත.

**දෙවන උපලේඛනය**

රක්ෂිත වගන්ති :

1. ඉඩමෙහි හා එය මතුපිට ඇති සියලු ඛණිජ ද්‍රව්‍ය (මේ ප්‍රදාන පත්‍රයෙහි ඛණිජ ද්‍රව්‍ය යන යෙදුම සම්බන්ධයෙන් මැණික් ගල් ද ඇතුළත් වේ.) පිළිබඳ හිමිකම් හා එවැනි යම් ඛණිජ ද්‍රව්‍ය හෑරීමේ, සෙවීමේ, ඒ පිළිබඳව කටයුතු කිරීමේ හා බැහැර ගෙන යෑමේ අයිතිය රජය වෙත වෙන්කර තබා ගනු ලැබේ.

2. ඉඩමට ඇති අයිතිකරුගේ හිමිකම මේ ප්‍රදාන පත්‍රයේ දිනට එම ඉඩම මත ඇති මාර්ග අයිතියනට හෝ වෙනත් පරවශ්‍යතාවයකට යටත් විය යුතුය.

කොන්දේසි :

1. මෙහි සඳහන් අවම අනු බෙදුම් ඒකකය, එනම් උස්බිම් හෙක්ටයාර් 0.100ට හෝ වාරිමාර්ග පහසුකම් සහිත ඉඩම් ......ට වඩා ප්‍රමාණයෙන් අඩු වූ මෙම ඉඩමේ බෙදා වෙන්කළ කොටසක්/අයිතිකරු විසින් බැහැර නොකළ යුතුය.
2. මෙහි නියමිත අවම භාගයකට වඩා අඩු එනම්, අක්කර 1/4 වඩා අඩු මෙම ඉඩමේ නොබෙදා වෙන්කළ කොටසක් අයිතිකරු විසින් බැහැර නොකළ යුතුය.
3. කිසිම තැනැත්තකු 1 වන කොන්දේසියේ සඳහන් අවම අනු බෙදුම් ඒකකයට වඩා අඩු ප්‍රමාණයක් වූ ඉඩමේ බෙදූ කොටසක අයිතිකරු නොවිය යුතුය.
4. 2 වන කොන්දේසියේ සඳහන් අවම භාගයට අඩු වූ ඉඩමේ නොබෙදූ කොටසකට කිසිම තැනැත්තකු අයිතිකරු නොවිය යුතුය.
5. ඉඩමට හෝ එහි කිසියම් කොටසකට ජලය සැපයිය හැකි නම් හෝ දැනටමත් ඉදිකර ඇති යම් වාරිමාර්ග කාර්යයන් ඉදිකිරීමක් හෝ ඉදිකිරීමට ඇති යමක් හේතුවෙන් ජලය සැපයිය හැකි බවට පත්වන්නේ නම් හෝ එම ජලය සැපයිය හැකි ප්‍රදේශය සම්බන්ධයෙන් අයිතිකරු (453 වන අධිකාරය වූ) වාරිමාර්ග ආඥාපනතේ විධිවිධානවලට හා ඒ යටතේ සාදන ලද රීතිවලට අනුකූලව කටයුතු කළ යුතුය.
6. දිසාපතිවරයාගේ ලිඛිත අවසරය දී උචිත බලධාරයාගෙන් බලපත්‍රයක් ද ලබා ඇත්නම් මිස, අයිතිකරු විසින් ඉඩමෙහි හෝ ඒ මතුපිට කිසිම ඛනිජ ද්‍රව්‍යයක් කැණීම, සෙවීම, ලබා ගැනීම, තමාගේ ප්‍රයෝජනයට ගැනීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම නොකළ යුතුය.
7. ප්‍රාදේශීය ලේකම්වරයාගේ පූර්ව ලිඛිත අවසරයක් ඇතිව මිස, ඉඩමෙහි හෝ එහි කිසිම කොටසක අයිතිය බැහැර නොකළ යුතුය.

පොළොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් ආරියසේන ගාල්ලගේ විසින් 2017.08.25 වැනි දින ලියා සහතික කරන ලද අංක 3330 දරන උකස්කරය අනුව මෙහි දක්වා ඇති උපලේඛනය පරීක්ෂා කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වැ. බ. සාමාන්‍යාධිකාරී.

2019 ජනවාරි මස 30 වැනි දින,
ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව,
ජාතික නිවාස සංවර්ධන අධිකාරී ගොඩනැගිල්ල,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත,
තැ.පෙ. 2085,
කොළඹ 02.

02-581

---

**මහජන බැංකුව - එප්පාවල ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වසරේ අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29 ඩී වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එප්පාවල කෝරළේ, තලාව ප්‍රාදේශීය සභා සීමාවට අයත් 373 එප්පාවල ග්‍රාම නිලධාරි වසමේ, 12 වන ගම (එප්පාවල) ග්‍රාමයේ පිහිටි අනුරාධපුර මිනින්දෝරු අධ්‍යක්ෂවරයා යටතේ ඇති කැඩැස්තර පිඹුරුපත් අංක 110172 හි කැබලිකිරීමේ පිඹුරේ ලොට් අංක 144 ලෙස දැක්වෙන රජයේ ඉඩමට මායිම්ව පිහිටි බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : හෙක්ටයාර් 0.2260 එහි පිහිටි ගොඩනැගිලි, එළවළු, පළතුරු සහ සියල්ල සහිතව ඉහත ඉඩමේ නව මායිම් බලයලත් මිනින්දෝරු පී. බී. ඉලංගසිංහ විසින් සාදන ලද සහ නැවත මනින ලද අංක 2014/AN 316 A දරන පිඹුරේ ලොට් අංක 144 ලෙස දැක්වේ.

ඉඩමේ ප්‍රමාණය .- හෙක්ටයාර් 0.2260 එහි පිහිටි ගොඩනැගිලි, එළවළු, පළතුරු සහ සියල්ල සහිතව.

දේපල වෙත පිවිසීම. - එප්පාවල නගරයේ සිට තඹුත්තේගම පාරේ ඔස්සේ කඩිගාව මංසන්ධියට පිවිසෙන්න. එතැනින් දකුණට ඇති තම්මැට්ටාව වැව පාරට හැරී මීටර් 50ක් පමණ ගිය විට අදාළ දේපළ පාරේ වම් පසින් පිහිටා ඇත.

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2019 මාර්තු 06 වැනි බදාදා දින පෙ. ව. 11.00 දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

තීරණය පිළිබඳ දැන්වීම. - කරුණාකර 2019 ජනවාරි මස 25 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, දිනමිණ, ඩේලි නිවුස් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

ගෙවීමේ ක්‍රමය.- මිළ තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය :-

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් 2 1/2% (සියයට දෙකහමාර) සහ එම කොමිස් මුදලට අදළ සියලුම බදු,
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500,
5. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු.

ගැනුම් මිලෙන් 90% (සියයට අනුව) ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ප්‍රාදේශීය කළමණාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක 75, මෛත්‍රීපාල සේනානායක මාවත, අනුරාධපුර වෙත ගෙවිය යුතු වේ. දුරකතන අංක 025 2222498/025 - 2222500.

ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10% ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතුවේ.

ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි වල පිටපත් ඉහත කී ලිපිනයෙන් ලබාගත හැක.

''ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි''

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 127 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

ප්‍රධාන කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරය :
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

නගර කාර්යාලය :
6 ඒ, ෆෙයාර්ෆීල්ඩ් ගාර්ඩන්ස්,
කොළඹ 08
දුරකථන අංක : 011-2671467, 011- 2671468
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2671469
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

02-601

---

**නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ,ගම්පහ දිස්ත්‍රික්කයේ, අදිකාරි පත්තුව, සියනෑ කෝරළේ හි මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, නො. 286 D ගෝනහේන දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ගෝනහේන ගමෙහි පිහිටි ''කෝන්ගහවත්ත අංක B'' දරන කැබැල්ල යළි බෙද වෙන් කර දක්වා ඇති ඉඩමට බලයලත් මානක වී. එෆ්. පෙරේරා මහතා විසින් මැන සාදන ලද 1998.07.25 දිනැති අංක 13940 දරන පිඹුරෙහි දැක්වෙන කැබලි අංක B 2 දරන ඉඩම් කැබැල්ල.

ප්‍රමාණය රූඩ් එකයි පර්චස් විසිපහයි දශම පහයි බිංදුවක් (අ. 0 රූ. 1 පර්. 25.50) විශාල ඉඩම් කොටස මෙම දේපළ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 434/51 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම සහ පරිශ්‍රය මත පිහිටි සියලුම ගොඩනැගිලි, නිශ්චල යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ, උපකරණ, සවි කිරීම්, එකී ඉඩම් කැබැල්ලට දැනට හෝ මෙයින් පසුව කලින් කලට ඇති කරන හෝ ස්ථිර වශයෙන් සිදුකරන ඇමුණුම් සහ සේවා ද සමග වන අතර විදුලිය සැපයීමේ පද්ධති සහ උපකරණ, ජලය සැපයීමේ පද්ධති සහ උපකරණ, විදුලි සංදේශ උපකරණ සහ වායු සමීකරණ උපකරණ සමග ද වේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. එන්. පී. කේ. හේරත් (මහත්මිය) විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2017.12.29 දිනැති අංක 160 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කොට ඇපකොට ලබා දුන් ණය මුදල ආපසු ගෙවීම කඩවත හි සිය ලියාපදිංචි කාර්යාලය සහිතව සහ 2016.03.17 දිනැති සහතික අංක WP 14941 යටතේ ලියාපදිංචි කරනු ලැබූ ''සූරියාරච්චි මෝටර් හවුස්'' යන නාමය විලාසය සහ ව්‍යාපාරය යටතේ බස්නාහිර පළාතේ ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයේ අයිතිකරුවන සූරියාරච්චි කංකානම්ලාගේ ආනන්ද ලලිත් සූරියාරච්චි (ණය ගැනුම්කරු) යන අය පැහැර ඇති හෙයින් ද, සූරියාරච්චි කංකානම්ලාගේ ආනන්ද ලලිත් සූරියාරච්චි ඉහත උපලේඛනයේ විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රය සඳහා සිය නිදහස් අයිතිවාසිකම්, හිමිකම් සහ බලපුළුවන්කාරකම් ඉහත කී අංක 160 දරන එකී උකස් බැඳුම්කරය යටතේ බැංකුවට උකස් කොට ඇති හෙයින් ද,

නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව, ඉහත සඳහන් එකී දේපළ 2019ක් වූ මාර්තු මස 12 වැනි දින ප. ව. 2.30 ට අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම. - කිරිබත්ගොඩ මංසන්ධියේ සිට මාකොළ පාරේ ඉදිරියට මාකොළ T මංසන්දිය දක්වා පැමිණ මාකොළ සිට දකුණු අතට ඇති මාවරමංඩිය පාරේ මාවරමංඩිය මංසන්ධිය දක්වාපැමිණ ගෝනහේන පාරේ මීටර් 400ක් පැමිණ දකුණු අතට ඇති මාවරමංඩිය පාරේ මීටර් 800ක් ගමන් කරන විට අදළ දේපළ පාරේ දකුණු අත පැත්තට වන්නට පාරට ආසන්නයේ පිහිටා ඇත. (මෙම ඉදිකරමින් පවතින නිවස දැනට වසා දමා ඇත)

ගෙවීම් කළ යුතු ආකාරය. - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. පළාත්පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
06. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 1,500,
07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2,500.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිළධාරීන්ගෙන් විමසන්න.

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු.

කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය,
බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු
අංක 200, හල්ස්ඩොෆ් වීදිය, කොළඹ 12
දුරකතන අංක 0773242954 - 0112 - 445393.

කළමණාකරු මධ්‍යගත (අයකිරීම්) අංශය,
නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී,
අංක 40, නවම් මාවත, කොළඹ 02
දුරකථන අංක 011- 2448448.

02-575

---

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීම

ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලයේ පල්ලේ පත්තුවේ මහරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ (නැගෙනහිර මාලපල්ල ග්‍රාම නිලධාරි වසමේ සහ මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ) මාලපල්ල ගමේ පිහිටි බටදෙඹගහලන්ද හෙවත් ගලවිලලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එම්. වීරකොන් බණ්ඩා විසින් මැන සාදන ලද අංක 1195 ඒ සහ 2007.09.07 දින දරන පිඹුර ප්‍රකාර බෙදවෙන් කළ කැබලි අංක ඊ 1 දරන බිම් කොටස. ප්‍රමාණය (අ. 0, රූ. 0, පර්. 17)

පර්චස් දහහතක් විශාල බිම් කැබැල්ල සහ ඉහත කී ඉඩමට පහත විස්තර කරන ඉඩම් මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග.

1. ඉහත කී මාලපල්ල ගමේ පිහිටි බටදෙඹගහලන්ද හෙවත් ගලවිලලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර බණ්ඩා විසින් මැන සාදන ලද අංක 1300 සහ 1967.10.07 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන්කළ කැබලි අංක ජී දරන බිම් කොටස. ප්‍රමාණය (අ. 0, රූ. 0, පර්. 24) පර්චස් විසිහතරක් විශාල ඉඩම් කැබැල්ල ය. මෙම දේපළ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 22/97 දරන වෙලුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී මාලපල්ල ගමේ පිහිටි බටදෙඹගහලන්ද හෙවත් ගලවිලලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර බණ්ඩා විසින් මැන සාදන ලද අංක 1300 සහ 1967.10.07 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන්කළ කැබලි අංක එෆ් දරන බිම් කොටස. ප්‍රමාණය පර්චස් දහඅටකුත් දශම පහක් (අ. 0, රූ. 0, පර්. 18.5)

විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි ඊට අයිති පස, ගහකොළ පළතුරු සෑම සියලු දේත් සමගය. තවද, ඉහත කී ඉඩම ට ඉහත විස්තර කරන ඉඩම් මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග. මෙම දේපළ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 22/98 දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ප්‍රසිද්ධ නොතාරිස් ඉෂාරා දිලුමිනි වීරක්කොඩි විසින් සහතික කරන ලද අංක 2646 හ 2016 ජනවාරි මස 22 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් ''දේපළ සහ පරිශ්‍රය එකී ඒකනායක ආරච්චිගේ බුද්ධික සඳුන් ඒකනායක යන අය විසින් ලබාගත් මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් බන්ධනදායී/උකස්කරු ලෙස එකී ඒකනායක ආරච්චිගේ බුද්ධික සඳුන් ඒකනායක යන අය විසින් කොළඹ 02 ''යුනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමින් උකස් කොට'' ඇපයට තබා ඇති බැවින් ද, එකී බැඳුම්කරය මගින් ඇප තබන ලද ඉහත කී පහසුකම් මත ආපසු ගෙවීම එකී ඒකනායක ආරච්චිගේ බුද්ධික සඳුන් ඒකනායක යන අය විසින් පැහැර හැරීම කර ඇති හෙයින්, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව ඉහත සඳහන් දේපළ 2019 ක් වූ මාර්තු මස 06 වැනි දින පෙ. ව. 10.00ට අදළ දේපළ පිහිටි ස්ථානයේදී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම. - හෝමාගම සිට අතුරුගිරිය දෙසට ඇති මාර්ගයේ මීටර් 450ක් ගමන් කරන විට හමුවන හතර මංසන්ධියෙන් වම් අතට ඇති ගලවිල පාරට හැරී කිලෝමීටර් 1.5 පමණ ගමන් කර (හෝමාගම රෝහල පසුකර) ඉදිරියට පැමිණෙන විට පාරේ වම් අතට ඇති තාර දැමූ ''නිසල පෙදෙස'' පාරට හැරෙන්න. එම මාර්ගයේ මීටර් 80 පමණ ගමන් කරන විට අදල දේපළ වම් පසින් පිහිටා ඇත.

ගෙවීම් කළ යුතු ආකාරය. - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. පළාත්පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
06. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 1,500,
07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 3,500.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිළධාරීන්ගෙන් විමසන්න.

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු.

කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය,
බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු
අංක 200, හල්ස්ඩොෆ් වීදිය, කොළඹ 12
දුරකතන අංක 0773242954 - 0112 - 445393.

නීති දෙපාර්තමේන්තුව,
නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී,
අංක 242 යුනියන් පෙදෙස,
කොළඹ 02.
දුරකථන අංක 011-4218744.

02-574

---

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීම

ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

උපලේඛනය .- බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ (ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ බියගම, දෙල්ගොඩ ප්‍රාදේශීය කාර්යාලයේ) බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 14 දරන නාගරික කොට්ඨාසයේ, අංක 271 දරන දකුණු ඉහළ මාකොළ ග්‍රාම නිලධාරි වසමේ, දකුණු මාකොළ හෙයියන්තුඩුවේ පිහිටි වර්තමානයේ ශ්‍රී පැරකුම්බා මාවතේ, වරිපනම් අංක 95/216 දරන හෙයියන්තුඩුව එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. ලක්ෂ්මන් ද සිල්වා විසින් මැන සාදන ලද අංක 508 සහ 1997 ජුනි මස 02 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදූ වෙන් කළ කැබලි අංක 7 බී දරන බිම් කොටස.

ප්‍රමාණය පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි සෑම සියලු දේත් සමග ය.

මෙම දේපළ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ භ 267/25 දරන වෙලුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී 7 බී දරන බිම් කොටස මෑත කාලයේ මැන සාදන ලද පිඹුර අනුව පහත සඳහන් පරිදි විස්තර කෙරේ. ඉහත කී මාකොළ හෙයියන්තුඩුවේ පිහිටි වර්තමානයේ වරිපනම් අංක 95/216 දරන හෙයියන්තුඩුව එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. ලක්ෂ්මන් ද සිල්වා විසින් මැන සාදන ලද අංක

508ඒ සහ 2015 අගෝස්තු මස 14 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙද වෙන්කළ කැබලි අංක 7බී [1] දරන බිම් කොටස ප්‍රමාණය පර්චස් දහයක් (අ. 0 රූ. 0 පර්. 10) විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි සෑම සියලු දේත් සමග ය.

තව ද, පහත ගමන් කිරීමේ මාර්ග අයිතින් ද සමග ය.

1. අංක 101 සහ 1960.05.30 වැනි දිනැති පිඹුරේ නිරූපිත බෙද වෙන් කළ කැබලි අංක 1 (පොදු පාරක් සඳහා වෙන් කිරීමක් වන), 2. අංක 1065 සහ 1991.11.12 සහ 27 දෙදින දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කළ කැබලි අංක ආර් 1 (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීමක් වන), 3. අංක 1065 සහ 1991.11.12 සහ 27 දෙදින දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කළ කැබලි අංක ආර් 2 (අඩි 15ක් පළල පාර සඳහා වෙන් කිරීමක් වන), 4. අංක 1065 සහ 1991.11.12 සහ 27 දෙදින දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කළ කැබලි අංක ආර් 4 (අඩි 30ක් පළල පාර සඳහා වෙන් කිරීමක් වන), 5. අංක 1065 සහ 1991.11.12 සහ 27 දෙදින දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කළ කැබලි අංක ආර් 5 (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීමක් වන), 6. අංක 1065 සහ 1991.11.12 සහ 27 දෙදින දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කළ කැබලි අංක 72 (පාර සඳහා වෙන් කිරීමක් වන).

ප්‍රසිද්ධ නොතාරිස් ඉෂාරා දිලුම්ණි වීරක්කොඩි විසින් සහතික කරන ලද අංක 2637 සහ 2015 දෙසැම්බර් මස 30 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය එකී කළුකපුගේ ඒන්ස්ලි නියෝමාල් පෙරේරා යන අය විසින් ලබාගත් මුල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් බන්ධනදයි/ උකස්කරු වශයෙන් ක්‍රියා කරමින් එකී කළුකපුගේ ඒන්ස්ලි නියෝමාල් පෙරේරා යන අය විසින් කොළඹ 02, යුනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමින් උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, එකී බැඳුම්කරය මගින් ඇප තබන ලද ඉහත කී පහසුකම් මත ආපසු ගෙවීම් එකී කළුකපුගේ ඒන්ස්ලි නියෝමාල් පෙරේරා යන අය විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව,

2019 ක් වූ මාර්තු මස 08 වැනි දින ප. ව. 1.30 ට අදළ දේපළ පිහිටි ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම. - කොළඹ සිට මහනුවර දක්වා ගමන් ගන්නා (A 1 ප්‍රධාන පාර) මාර්ගයේ කිලෝමීටර් 12ක් ගමන් කර කිරිබත්ගොඩ මාර්ග ආලෝක සංඥ ඇති මංසන්ධියට පැමිණ එතැනින් දකුණු අතට දිවෙන මාකොළ පාරේ කිලෝමීටර් 2.8ක් ගමන් කර මාකොළ මන්සංදිය දක්වා පැමිණ, වම් අතට ඇති මාවරමංඩිය පාරේ තවත් කිලෝමීටර් 2.1ක් ගමන් කරන විට හමුවන මාකොළ මහා විද්‍යාලය පසුකර දකුණු අතට ඇති ප්‍රාදේශීය සභා පාරට හැරී තරුණ සේවා සභාව දක්වා ගමන් කරන අතර එතැනින් දකුණු අතට ඇති තියුණු වංගුවෙන් හැරෙන්න. මෙම මාර්ගයෙන් කෙලින් ම සදළු උයන නිවාස යෝජනා ක්‍රමය දක්වා පැමිණිය හැකි අතර අවසානයේදී දකුණට පාර්ක් වීව් හංදියෙන් හැරී මීටර් 40ක් ගමන් කරන විට මෙම දේපළට ළඟාවිය හැක. මෙම මාර්ගයේ කොන්ක්‍රීට් ගල් අතුරා ඇති අඩි 20ක් පළල පාරකි.

ගෙවීම් කළ යුතු ආකාරය. - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02. ඉතිරි සියයට අනුව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුලත නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී හි තැන්පත් කළ යුතු ය.
03. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
04. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%)
05. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
06. ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,500,
07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 3,500.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිළධාරීන්ගෙන් විමසන්න.

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ තක්සේරුකරුවෝ සහ
උසාවි කොමසාරිස්වරු.

කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය,
බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු,
අංක 200, හල්ස්ඩ්‍රොෆ් වීදිය, කොළඹ 12
දුරකතන අංක 077 3242954 - 0112 445393

නීති දෙපාර්තමේන්තුව,
නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී,
අංක 242, යුනියන් පෙදෙස,
කොළඹ 02.
දුරකතන අංක 011 4218743.

02-572

---

**නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසිය

**අත්තනගල්ල කළගෙඩිහේනේ පිහිටි පෙළහල එස්ටේ දන් ෂෙරිමල් එස්ටේට් හි පිහිටි අගනා නිවසක් සමග පර්චස් 35ක් විශාලැති දේපළක්.**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ මැද පත්තුවේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් සහ ප්‍රාදේශීය සභා සීමාවේ අංක 322 B කළගෙඩිහේන තිරිවනේගම ග්‍රාම නිලධාරි වසමේ කළගෙඩිහේනේ හි පිහිටා ඇති ''පෙළහල එස්ටේට් දැනට ෂෙරිමල් එස්ටේට්'' දරන ඉඩමට 2015 ජූලි මස 16 වැනි දින බලයලත් මිනින්දෝරු කේ. කේ. එස්. පද්මිනි විසින් සාදන ලද අංක 12375 දරන පිඹුරේ දැක්වෙන කැබලි අක්ෂර A (බලයලත් මිනින්දෝරු අයි. කොටඹගේ 1998.06.11 වැනි දිනැති අංක 2574 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 16 සහ 17 ඒකාබද්ධ කළ ඉඩම) සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ පළතුරු ඇතුළු ඒ තුළ පිහිටි සියළු දේ.

ඒ සමඟම ඒ තුළ පිහිටා ඇති ගොඩනැගිලි සහ ඉඩමේ සහ පරිශ්‍රයේ දැනට සහ මින් මතුවට ස්ථිරවම සවි වී හෝ සවිකර හෝ සම්බන්ධ කර ඇති සෑම සහ සියළුම යන්ත්‍ර සූත්‍ර උපකරණ ඇමණුම් ද ඇතුළුව එයට පමණක් සීමා නොවී විදුලිය සැපයීමේ පද්ධතිය සහ විදුලි සංදේශ පද්ධතිය වේ.

අංක 283 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අමරසිංහගේ සමීර රනන්ජය අමරසිංහ ණයට ගන්නා වශයෙන් පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී දේපළ වර්ෂ 2019ක් වූ මාර්තු මස 15 වැනි දින පෙරවරු 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2019.01.04 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය ද, 2018.12.17 වැනි දින ''ද අයිලන්ඩ්'' ''දිවයින'' යන පුවත්පත් සහ ''තිතකුරල්'' යන පුවත්පත් බලන්න.

දේපළට ප්‍රවිශ්ඨ විය හැකි මාර්ගය .- යක්කල සිට කොළඹ මහනුවර ප්‍රධාන මාර්ගයේ කළගෙඩිහේන මංසන්ධිය දක්වා ගමන් කර වමට හැරී වේයන්ගොඩ පාරේ කෙටි දුරක් ගමන් කර වමට හැරී මගලගොඩ පාරේ මීටර් 300ක් පමණ සිරිමල් උයන දක්වා ගමන් කර වම් පසට හැරී මීටර් 300ක් පමණ ගමන් කර වමට හැරී අඩි 15 පළලැති පාර අවසානයේ මෙම දේපළ පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි :-

(01) ගැණුම් මුදලින් 10% ක් ද, (02) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් ද සහ වැට් බද්ද, (03) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් ද, (04) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (05) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1500 ක් ද, (06) විකිණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 3000 ක් ද වේ. ගැණුම් මිලෙන් ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, නවම මාවතේ, අංක 40 දරන ස්ථානයේ පිහිටි නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි කළමනාකරු මධ්‍යගත ණය අයකිරීම් ගෙන් විමසන්න.

දුරකථන අංක : 2448448, 011 - 7448448.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656, 0777 672082
ෆැක්ස් අංකය : 2871184

02-531

---

**සීමාසහිත ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක්**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසිය

**මාතර පුහුල්වැල්ල කිරින්ද ග්‍රාමයේ පිහිටි රූඩ් 02, පර්චස් 36.70 විශාලැති අගනා දේපළක්.**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, ගඟබොඩ පත්තුවේ කිරින්ද ග්‍රාමයේ පිහිටි ''මොරගහහේන'' යනුවෙන් හඳුන්වන ඉඩමෙහි බලයලත් මානක සී. එස්. ජයවර්ධන විසින් සාදන ලද 2006.08.14 වැනි දිනැති අංක 2006/344 දරන පිඹුරෙහි කැබලි අක්ෂර A ලෙස ලකුණු කර ඇති ප්‍රමාණයෙන් රූඩ් 02යි, පර්චස් 36.70ක් විශාලැති බෙද වෙන් කළ ඉඩම සහ එහි පිහිටි පස, ගහකොළ වැවිලි ගොඩනැගිලි ඇතුළු සෑම දේත්.

සීමාසහිත ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ටී. එම්. ආර්. සේනානායක විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2007 මාර්තු මස 29 දිනැති අංක 870 සහ 2007 ඔක්තෝබර් මස 31 වැනි දින දරන උකස්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සීමාසහිත ඊස්ටර්න් ස්පයිසස් (පුද්ගලික) සමාගම ණයකරු හැටියට පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී දේපළ 2019ක් වූ මාර්තු මස 22 වැනි දින පෙ. ව. 11.30 ට එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2018.11.02 වැනි දින ශ්‍රී ලංකා රජයේ ගැසට් පත්‍රය ද, ''ද අයිලන්ඩ්'' ''දිවයින'' සහ ''තිනකුරල්'' පුවත්පත් බලන්න.

දේපළ පිවිසෙන මාර්ගය. - මාතර නගරයේ සිට පුහුල්වැල්ල මංසන්දිය දක්වා කි. මී. 16ක් ගමන් කිරීමෙන් මෙම දේපළට කි. මී. 1.2 එපිටින් මෙම දේපළ පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි :-

(01) ගැණුම් මුදලින් 10% ක මුදල ද, (02) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් ද සහ වැට් බද්ද, (03) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් ද, (04) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (05) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 3,000 ක් ද, ගෙවිය යුතු වන අතර විකුණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ඉහත කී බැංකුවේ තැන්පත් කළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා නුගේගොඩ නාවල පාරේ අංක 80 දරන ස්ථානයේ පිහිටි සීමාසහිත ලංකාපුත්‍ර ඩිවෙලොප්මන්ට් බැන්ක් කළමනාකරු ණය ආපසු අයකිරීම් ගෙන් විමසන්න.

දුරකථන අංක : 011 2821030, 011 2821035.
ෆැක්ස් අංකය : 011 2821031.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656, 0777 672082
ෆැක්ස් අංකය : 2871184

02-532

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

1. ණය යොමු අංක - 80211113, 80211244 සහ ජංගම ගිණුම් අංක 73048886

කොළඹ 14, ලෙයාර්ඩ්ස් බ්‍රෝඩ්වේ, අංක 151හි මොහොමඩ් අල්තාෆ නවාස් මහතා සහ අයිනුල් ෆවුසියා නවාස් මිය යන අයට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

2. ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී රනරජයේ 2018.09.21 දිනැති අංක 2090 දරන ගැසට් පත්‍රයේ හා 2018.09.07 දින ''ඩේලිනිව්ස්'', ''දිනමිණ'' හා ''තිනකරන්'' යන පුවත්පත් වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2019.03.05 වැනි දින ප. ව. 1.30 ට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**පළමු උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ පල්ලෙපත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාවේ , මෝදර මට්ටක්කුලිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංක 4 දරන අලුත් මාවත කොට්ඨාසයේ, බ්ලූමැන්ඩල් පාර හා මී. 3.05 ක (අඩි 10 පළල) පාරත් දිගට පිහිටි බ්ලූමැන්ඩල් පාරේ වරිපනම් අංක 751B දරන ඉඩමට එහි ඇති ගොඩනැගිල්ල, ගහකොළ, වගාවන් හා බාහිර සියලු දේ සහිතව බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් සාදන ලද 1998 ජූලි මස 11 වැනි දිනැති අංක 6552 A දරන පිඹුරෙහි ලොට් B3A ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම්, එකී ලොට් B3A ඊසාන දිගට : එකී අංක 397 දරන පිඹුරෙහි ලොට් B4 මී.3.05 (අඩි 10 පළල) පාර සහ බ්ලූමැන්ඩල් පාර ද, ගිනිකොණට : මෙහි ලොට් B3B සහ බ්ලූමැන්ඩල් පාරේ වරිපනම් අංක 749 දරන පරිශ්‍රය ද, නිරිතට : අලුත් මාවත පාරේ වරිපනම් අංක 538 දරන පරිශ්‍රය ද, වයඹට : බ්ලූමැන්ඩල් පාරේ වරිපනම් අංක 751A දරන අංක 397 දරන එකී පිඹුරෙහි ලොට් B2 ද මායිම්ව එකී අංක 6552A දරන පිඹුරට අනුව පර්චස් එකොළහයි දශම පහයි පහක (අ. 0, රූ. 0, පර්. 11.55) ක බිම් ප්‍රමාණයකින් යුක්ත වේ.

එකී ලොට් B3A පහත විස්තර කර ඇති ඉඩමෙහි උප බෙදීමකි.

එකී මෝදර පිහිටි ඉඩමට එහි ඇති ගොඩනැගිල්ල, ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ සමග බලයලත් මිනින්දෝරු සී. එච්. ඩයස් අබේගුණවර්ධන විසින් සාදන ලද 1985.03.05 වැනි දින අංක 397 දරන පිඹුරෙහි ලොට් අංක B3 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම්, එකී ලොට් B3, ඊසාන : දිගට ලොට් B4ද, ගිනිකොණට : කේ. සිරිල් සී පෙරේරා මාවත සහ කේ. සිරිල් සී පෙරේරා මාවතේ වරිපනම් අංක 749 දරන පරිශ්‍රය ද, නිරිතට : කේ. සිරිල් සී පෙරේරා මාවතේ වරිපනම් අංක 749 සහ අලුත් මාවත පාරේ අංක 538 දරන පරිශ්‍රයන් ද, වයඹට : ලොට් B2 ද මායිම්ව එකී අංක 397 දරන පිඹුරට අනුව පර්චස් එකොළහයි දශම අටයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 11.80) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 730/121 හි ලියාපදිංචි කර ඇත.

**දෙවන උපලේඛනය**

එකී මෝදර පිහිටි බලයලත් මිනින්දෝරු සී. එච්. ඩයස් අබේගුණවර්ධන විසින් සාදන ලද 1985.03.05 දිනැති අංක 397 දරන පිඹුරෙහි ලොට් B4, (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම්, එකී ලොට් B4 ඊසානට : එම ඉඩමේ ලොට් A ද, ගිනිකොණට : කේ. සිරිල් සී පෙරේරා මාවත ද, නිරිතට : ලොට් B3 හා B2 ද, වයඹට : ලොට් B1 ද මායිම්ව එකී අංක 397 දරන පිඹුරට අනුව පර්චස් දහයක (අ. 0, රූ. 0, පර්. 10) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 730/122 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ටී. ඩී. වලවගේ මිය,
කළමනාකාරිණී.

ලංකා බැංකුව,
අලුත්කඩේ ශාඛාව.

සටහන .- ණයකරු රු. 1,100,000.00ක් ''අවිනිශ්චිත ගිණුම ණය'' හි තැන්පත්කර ඇති බැවින් 2018.12.29 වැනි දිනට නියමිතව තිබූ වෙන්දේසිය අවලංගු කර ඇති අතර එකී වෙන්දේසිය වෙනුවෙන් බැංකුව විසින් සිදු කළ වෙන්දේසිකරුවන්ගේ ගාස්තු අයකර ගැනීමෙන් අනතුරුව රු. 1,056.500.00 ක් ඉතිරිව ඇත.

02-625

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

1. ණය යොමු අංක 76643416 ජංගම ගිණුම් අංක 75561409 දියසෙන්පුර, පාසල් මාවතේ, ජයබිම ලංකා පිරවුම්හලෙහි තනි අයිතිකාර වෙලේ මුදියන්සේලාගේ ජයසිරි අබේරත්න මහතාට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

2. ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2018 ජුනි මස 08 දිනැති ගැසට් පත්‍රයේ හා 2018 ජුනි මස 07 වැනි දින ''ඩේලි නිව්ස්'' ''දිනමිණ'' හා ''තිනකරන්'' යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2019 මාර්තු මස 07 වැනි දින පෙ. ව. 11.00 ට ජයබිම ලංකා පිරවුම්හලෙහි අයිතිකාර වෙලේ මුදියන්සේලාගේ ජයසිරි අබේරත්න මහතාට අයත් උකස් කරන ලද දේපළ, කොළඹ 08, ෆෙයාර් ෆීල්ඩ් ගාර්ඩ්න්, 6 ඒ හි වෙන්දේසිකාර ෂොක්මන් ඇන්ඩ් සමරවික්‍රම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**පළමු උපලේඛනය**

එකී උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවේ සිංහල පත්තුවේ, අංක 88 දරන දියසෙත්පුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කවුඩුලුවැව අදියර I ග්‍රාමයේ "ගොඩ ඉඩම" නැමති ඉඩමේ බලයලත් මිනින්දෝරු එන්. මහාලිංගම් විසින් සාදන ලද 1996.09.16 වැනි දිනැති අංක NM/111 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට : ලොට් අංක 142 සහ 141 ද, නැගෙනහිරට : ලොට් අංක 2 ද, දකුණට : වාරිමාර්ග ඇල ද, බස්නාහිරට : ලොට් අංක 140 ද මායිම්ව අක්කර එකක (අ. 1, රූ. 0. පර්. 0) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ. මෙය පොළොන්නරුව දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L.D.O F/7/85 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම බලයලත් මිනින්දෝරු පී.බී. ඉලංගසිංහ විසින් මෑතකදී මැන සාදන ලද 2014.06.01 වැනි දිනැති අංක 2014/PO/37 දරන පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කොට ඇත.

එකී කවුඩුලුවැව අදියර I ග්‍රාමයේ "ගොඩ ඉඩම" නැමති ඉඩමේ බලයලත් මිනින්දෝරු පී.බී. ඉලංගසිංහ විසින් සාදන ලද 2014.06.01 වැනි දිනැති අංක 2014/PO/37 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 01 උතුරට : F.C.P.Po 82 හි ලොට් අංක 142 සහ 141 ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එන්. මහාලිංගම් විසින් සාදන ලද අංක NM/111 දරන පිඹුරෙහි ලොට් අංක 2 ද, දකුණට : පාර (වාරිමාර්ග දෙපාර්තමේන්තුව) ද, බස්නාහිරට : F.C.P.Po 82 හි ලොට් අංක 140 ද මායිම්ව අක්කර එකක (අ. 1, රූ. 0. පර්. 0) හෙවත් හෙක්ටයාර බිංදුවයි දශම හතරයි බිංදුවයි හතරයි හයක (හෙක්ටයාර 0.4046) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ.

මෙම ඉඩම බැංකුවට උකස් කිරීම සඳහා මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම්ගේ පූර්ව අනුමැතිය ඔහුගේ 2014.07.16 සහ 2016.11.08 වැනි දිනැති ලිපි මගින් ඔහුගේ අංක එන්සීපී/එම්පී/එල්4/බැංකු/ඇප දරන යොමු අංකය යටතේ ප්‍රදානය කර ඇත.

**දෙවන උපලේඛනය**

වෙන්කිරීම් :

01. ඉඩම තුළ හෝ ඒ මත ඇති සියලු ඛණිජ (මෙම යෙදුමට මෙම ප්‍රදානයේදී වටිනා ගල් ද ඇතුළත් වේ.) වල හිමිකම සහ කැනීමට සෝදිසි කිරීමට, වැඩ කිරීමට හා එවන් ඛණිජ බැහැරට ගෙනයාමට ඇති අයිතිය රජය වෙත වෙන්කර තබා ඇත.

02. ඉඩමට අයිතිකරු වශයෙන් ඇති හිමිකම මෙම ප්‍රදානය කරනු ලබන දිනයට ඉඩම මත පවතින මාර්ග අයිතිය හෝ ඉඩම මත ඇති අනෙකුත් පරවශතාවන්ට යටත් වේ.

කොන්දේසි :

01. අයිතිකරු විසින් ගොඩ ඉඩමෙන් ජලය සපයා ඇති ඉඩමෙන් අක්කර 1 1/2 වශයෙන් මෙහි නම් කොට නිශ්චිතව දක්වා ඇති බිම් ප්‍රමාණයකටම වඩා අඩු උප බෙදීම් ඒකකයක් මෙම ඉඩමෙන් බැහැර නොකළ යුතුය.

02. අයිතිකරු විසින් මෙහි අක්කර 1/7 ලෙස නම් කොට නිශ්චිතව දක්වා ඇති ඉඩම කොටසකට වඩා අඩු නොබෙදූ කොටසක් බැහැර නොකළ යුතුය.

03. කිසිවකුට ඉහත කොන්දේසි 1 හි නිශ්චිතව දක්වා ඇති උප බෙදීම් ඒකකයකට වඩා ප්‍රමාණයෙන් අඩු බෙදන ලද කොටසක අයිතිකරුවකු විය නොහැක.

04. කිසිවකුට ඉහත කොන්දේසි 2 හි නිශ්චිතව දක්වා ඇති උප බෙදීම් ඒකකයකට වඩා ප්‍රමාණයෙන් අඩු බෙදන ලද කොටසක අයිතිකරුවකු විය නොහැක.

05. ඉඩමට හෝ එහි කිසියම් කොටසකට ජලය සැපයිය හැකි නම් හෝ දැනටමත් ඉදිකර ඇති යම් වාරිමාර්ග කාර්යයන් ඉදිකිරීමක් හෝ ඉදිකිරීමට ඇති යමක් හේතුවෙන් ජලය සැපයිය හැකි බවට පත්වන්නේ නම් හෝ එම ජලය සැපයිය හැකි ප්‍රාදේශීය සම්බන්ධයෙන් අයිතිකරු වාරිමාර්ග ආඥාපනතේ (453 වගන්තිය) ඇති ප්‍රතිපාදන වලට අනුකූලව කටයුතු කළ යුතුය.

06. දිසාපතිගෙන් ලිඛිතව අවසරයක් සහ අදාළ අධිකාරිගෙන් බලපත්‍රයක් ලබා නොගෙන එම ඉඩම මත හෝ ඒ තුළ ඇති කිසිදු ඛනිජ ද්‍රව්‍යන් හෑරීම, සෙවීම, භාවිතයට ගැනීම අයිතිකරු විසින් නොකළ යුතුය.

07. ප්‍රාදේශීය ලේකම්ගේ පූර්ව අනුමැතිය ලිඛිතව ලබා නොගෙන මෙම ඉඩම හෝ එහි ඕනෑම කොටසක් බැහැර නොකළ යුතුය.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ජී. පී. උදයරත්න,
කළමණාකරු.

2019 ජනවාරි මස 28 වැනි දින,
ලංකා බැංකුව,
මැදිරිගිරිය.

02-626

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

(1) ණය පහසුකම් යොමු අංක - 77165739 සහ 82302350

වෙන්නප්පුව, දුම්මලදෙනිය බටහිර, අබේසේකර වන්නක්කු ආරච්චිගේ දෙන් අනුර නිශාන්ත කුමාර අබේසේකර මහතා, හෙවත් වන්නක්කු ආරච්චිගේ දෙන් අනුර නිශාන්ත කුමාර් මහතාට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2018.12.28 දිනැති අංක 2104 දරන ගැසට් පත්‍රයේ හා 2018.12.13 වැනි දින ඩේලිනිව්ස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත් වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අය කර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2019.04.23 වැනි දින පෙ. ව. 11.00 කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 ටී ඇන්ඩ් එච් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**උපලේඛනය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ, කම්මල්පත්තුවේ, වෙන්නප්පුව ප්‍රාදේශීය සභා සීමාවේ වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උල්හිටියාව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උල්හිටියාව පිහිටි "අඹගහවත්ත හෙවත් බෝගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු වයි. එම්. ආර්. යාපා විසින් සාදන ලද 1996.03.16 දිනැති අංක 4806 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට : අයිවන් ප්‍රනාන්දුගේ එම ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : හලාවත සිට කොළඹ දක්වා මහා මාර්ග ය ද, දකුණට : ලොට් 2 ද, බස්නාහිරට : අයිවන් ප්‍රනාන්දුගේ එම ඉඩමේ ඉතිරි කොටස ද මායිම්ව පර්චස් දහයක (අ. 0, රූ. 0, පර්. 10) බිම් ප්‍රමාණකින් යුක්ත වන අතර එහි වෙනත් සෑම දේද වේ. මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G120/239 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. එන්. ඒ. සෙනෙවිරත්න මයා,
කළමණාකරු.

ලංකා බැංකුව,
වෙන්නප්පුව.

02-627

---

HNB 09 -18.

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - අතුරුගිරිය ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් සහතික කරන ලද්ද වූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දවූ ද, 2017 ජූලි 07 වැනි දින සහතික කළ අංක 6971 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම යුනියන් මෙට්ල් (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂවරුන් වන ස්මෙත් අහමඩ් සාවාහිර් ධනරාජා රාමරත්නම් සහ ජනිකා ලන්කේෂ්වරී සාවාහිර් ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියළු ස්ථාපිත ගෙවීම්. සහ වෙන්දේසිකරුගේ ගාස්තුව ඇතුළු සියලුම මුදල් අය කර ගැනීම පිණිස පහත උපලේඛනයේ විස්තර කර ඇත්තාවූ යන්ත්‍ර සූත්‍ර සහ බඩුබාහිරාදිය එම දේපළ පිහිටි ස්ථානයේ දී වර්ෂ 2019ක් වූ මාර්තු මස 14 වැනි දින පෙ. ව. 11.30 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උපලේඛනය

පහත සඳහන් තනි සහ සියලු චංචල යන්ත්‍රෝපකරණ සහ බඩුබාහිරාදිය ඇතුළත් වේ.

| විස්තරය | මාදිලිය | පැබ්රිකේෂන්/ අනුක්‍රමික අංක |
|---|---|---|
| ස්ක්රූ කම්ප්‍රේසර් විත් ටැන්ක් | EN 22-7 | ANDC370085 |
| රෙෆ්රිපිරේටඩ් එයාර් ඩ්‍රයර් | ELRD -200 | 6760-07/14 |
| ෂොට් බ්ලාස්ටින් මැෂින් | SB : SP:4 | M:14.8343 |
| 25 ෆිට් 3 සෝන් ඉලෙක්ට්‍රික් අවන් | | Fabricated in 2014 |
| ඔටෝ මැටික් බෙස්ග්රූවින්/බැන්ඩින් | BO32AOOO | 80141500138 |
| නියුමැටික් රිවර්ටින් ඉම්පැක්ට් ප්‍රේස් | IP 3-5-6-14 | |
| ස්ප්‍රේ ගන්ස් 02 | IWA - Japan | |
| හෝල් ප්‍රන්චින් ප්‍රේස් | "C" type frame | |
| කාස්ට් අයර්න් මොඩ්ල්ස් (09) | Diameter220 mm & 240 mm | |
| මෙට්ල් වෙයාර් වොෂින් ලයින් | ZQX | 1390 |

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පට්ටිවල උතුර 279 ග්‍රාම නිලධාරී වසමේ කැලණිය ගෝනවල පට්ටිවිල පාරේ 53/3 හි පිහිටි (මින් ඉදිරියට පොදුවේ ණයකරු හට අයිති චංචල දේපල, යන්ත්‍රෝපකරණ හා උපාංග සියල්ල සහ ආයුධ සහ උපකරණ) කොටස් යන සියළු දේ සහ ණයකරු වෙනත් ඕනෑම පරිශ්‍රයක කලින් කලට පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර ගනුදෙනු හා ණයකරු මින් ඉදිරියට අදළ පරිශ්‍ර හෝ වෙනත් පරිශ්‍ර තුළ ගබඩා කරන්නාවූ සියලු බඩුබාහිරාදිය සහ ණයකරුගේ ඉහත සඳහන් පරිශ්‍ර වලින් බැහැරව ගෙන යනු ලබන යන්ත්‍රෝපකරණ සහ ණයකරුට අයිති චංචල දේපල ගබඩා කර ඇති වෙනත් පරිශ්‍ර සියල්ල හා සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2018.08.24 වැනි දින දරන රජයේ ගැසට් පත්‍රය හා 2018.09.05 දිනැති ලක්බිම, ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

දේපළට පිවිසීම. - අංක 53/3, පට්ටිවිල පාර, ගෝනව, කැලණිය.

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම්කරු විසින් සම්පූර්ණ මුදල ගෙවා යන්ත්‍රෝපකරණ ඉවත් කර ගත යුතු ය.
2. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
3. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (රු. 2,000)ක් ද,
4. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500)ක් ද,
5. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම් ද වේ.

හිමිකම් ඔප්පු හා අදාල ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්), හැටන් නැෂනල් බැන්ක් පී එල්සී, අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකතන අංක : 011- 2661828, 2661866.

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 59, කුමාර මාවත, පටුවත, දෙඩන්දූව
දුරකතන අංක 091-2277105, 0779-663420
ඊමේල් : ejayawardhana77@gmail.com

02-470

---

**නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**පළමු උපලේඛනය**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, මාතර නගර සභා සීමාව තුළ, නූපේ හි පිහිටි තොටමුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, වරිපනම් අංක 317 දරන ''ආදම්ගේවත්ත'' සහ විජේනායක ගෙදරවත්ත නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක සී. එස්. ජයවර්ධන මහතා විසින් මැන සාදන ලද 2009.09.23 දිනැති අංක 2009/94 දරන පිඹුරෙහි දැක්වෙන කැබලි අංක A (ඒකාබද්ධ කැබලි අංක 1 සහ 2, 1 සහ 3) ලෙස ලකුණු කර බෙදවෙන් කරන ලද ඉඩම් කැබැල්ල.

ප්‍රමාණය පර්චස් දොළහයි දශම දෙකයි පහ (අ. 0, රූ. 0, පර්. 12.25) විශාල ඉඩම් කොටස මෙය වෙළුම/පත්ඉරුව ඒ 780/42 යටතේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

**තෙවන උපලේඛනය**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, ගඟබොඩ පත්තුව, කිරින්ද හි පිහිටි කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, කිරින්ද (ඉහළ කොට්ඨාසයේ) ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කිරින්ද හි පිහිටි ''බටදොලහේන'' හෙවත් ගොඩැල්ල හේන (අංක ටීපී 155666) නමින් හදුන්වනු ලබන ඉඩමට බලයලත් මානක පී. එම්. අබේගුණවර්ධන මහතා විසින් මැන සාදන ලද 2013.10.09 දිනැති අංක 613 දරන පිඹුරෙහි දැක්වෙන කැබලි අංක 3 ලෙස ලකුණු කර බෙද වෙන් කරන ලද ඉඩම් කොටස.

ප්‍රමාණය රූඩ් එකයි පර්චස් විසිහතරයි දශම හත (අ. 0, රූ. 1, පර්. 24.7) විශාල ඉඩම් කොටස වෙළුම/පත්ඉරුව කේ 29/13 යටතේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

තවද, පහත සඳහන් මාර්ගය දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, ගඟබොඩ පත්තුව, පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, කිරින්ද හි පිහිටි කිරින්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, බටදොලහේන හෙවත් ගොඩැල්ල හේන (අංක ටීපී 155666)නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක පී. එම්. අබේගුණවර්ධන මහතා විසින් මැන සාදන ලද 2013.10.09 දිනැති අංක 613 දරන පිඹුරෙහි දැක්වෙන කැබලි අංක 1 සහ 2 ලෙස ලකුණු කර බෙද වෙන් කරන ලද ඉඩම් කැබැල්ල ප්‍රමාණය අක්කර හතරයි රූඩ් හයයි පර්චස් පහයි දශම දෙක (අ. 4, රූ. 6, පර්. 5.2) යන ඉඩම වේ. මෙය මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 117/161 යටතේ ලියාපදිංචි කර ඇත.

දෙවන උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළේ, කොටපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, වරල්ලහි පිහිටි වරල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පිහිටි ''පීල්ලහේන සහ පීල්ලහේනදෙණිය'' හෙවත් මාගම ඕකන්දම නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක අරුණ ජයන්ත ජයසේකර මහතා විසින් මැන සාදන ලද 2009.09.13 දිනැති අංක 219/2013 දරන පිඹුරෙහි දැක්වෙන කැබලි අංක A5 ලෙස ලකුණු කර බෙද වෙන් කරන ලද අංක A5 දරන ඉඩම් කොටස.

ප්‍රමාණය අක්කර දෙකක (අ. 2, රූ. 0, පර්. 0)
විශාල ඉඩම් කොටස මෙය වෙළුම/පත්ඉරුව බී 36/03 යටතේ කොටපොළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

තවද, පහත මාර්ග අයිතිය සමග වේ. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළේ, කොටපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, වරල්ලහි පිහිටි වරල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පිහිටි පීල්ලහේන සහ පීල්ලහේනදෙණිය හෙවත් මාගම ඕකන්දම නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක අරුණ ජයන්ත ජයසේකර මහතා විසින් මැන සාදන ලද 2013.09.13 දිනැති අංක 219/2013 දරන පිඹුරෙහි දැක්වෙන කැබලි අංක A4 (පාර) ලෙස ලකුණු කර බෙද වෙන්කරන ලද ලොට් A4 දරන ඉඩම් කැබැල්ල ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසිඅටයි දශම පහයි හත (අ. 0, රූ. 1, පර්. 28.57) යන ඉඩම වේ. මෙය කොටපොළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 36/56 යටතේ ලියාපදිංචි කර ඇත.

තවද, ඉහත සඳහන් ඉඩම් මත ඇති යන්ත්‍රෝපකරණ, ජල සම්පාදන පද්ධති උපකරණ, විදුලි සංදේශ උපකරණ සහ වායු සමන උපකරණ සහ විදුලි සැපයුම් පද්ධති ද ඇතුළත් ඉහතින් මැනවින් සඳහන් කොට ඇති එකී ඉඩම් කොටසට සහ පරිශ්‍රයන්ට දැන් හෝ මින් මතුවට හෝ කලින් කලට සවිකරනු ලබන හෝ ස්ථිරව යා කොට සවිකරනු ලබන සියළුම සහ එක් එක් චංචල යන්ත්‍රාගාර යන්ත්‍රෝපකරණ සවිකිරීම් වැද්දුම් සහ සේවාවන් ද සමගය.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පිඑල්සී (බැංකුව) නමින් ප්‍රසිද්ධ නොතාරිස් බී. ඒ. අනුරුද්ධිකා විසින් ලියා සහතික කරන ලද 2014.11.10 දතම, අංක 2061 දරන හා 2015.08.07 දතම හා අංක 2364 දරන උකස් බැදුම්කරයන් සහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. ජේ. පතිරණ විසින් ලියා සහතික කරන ලද 2016.09.20 දතම හා 96 දරන උකස් බැදුම්කරය මගින් මෙහි 1 කොටස II කොටස III කොටස ලෙස විස්තර කර ඇති උපලේඛනයේ සදහන් දේපළ සහ පරිශ්‍රය උකස්කොට ඇපකොට ලබා දුන් ණය මුදල් පහසුකම් ආපසු ගෙවීම පුහුල්වැල්ල ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටි දකුණු පළාතේ ප්‍රාදේශීය ව්‍යාපාරික නාම රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි අංක S/MA/KI/4/196 දරන ''බටදොළ ස්ටේට් සිනමන් ප්‍රොසෙසර්ස්'' තනිපුද්ගල ව්‍යාපාරයේ අයිතිකරු වන චන්දන කුමාර ජුවනබදු සිල්වා (ණය ගන්නා) විසින් පැහැර හැර ඇති හෙයින් ද, තවද චන්දන කුමාර ජුවනබදු සිල්වා යන අය පහත උපලේඛනයේ I කොටස, II කොටස සහ III කොටස ලෙස විස්තර කරන දේපළ හා පරිශ්‍රය සඳහා සිය නිදහස් අයිතිවාසිකම් හිමිකම් බලපුළුවන්කාරකම් අංක 2364, 2061 සහ 96 දරන එකී උකස් බැදුම්කරයන් යටතේ බැංකුවට උකස්කොට ඇති බැවින්,

නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව, ඉහත සඳහන් දේපළ

1 වන උපලේඛනය 2019ක් වූ මාර්තු මස 06 වැනි දින ප.ව. 2.30 ට
3 වන උපලේඛනය 2019ක් වූ මාර්තු මස 07 වැනි දින පෙ. ව. 9.30 ට
2 වන උපලේඛනය 2019ක් වූ මාර්තු මස 07 වැනි දින ප. ව. 2.00 ට

අදළ දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම. -
1 වන උපලේඛනය
මාතර බෝධියේ සිට කුමාරතුංග මාවතේ කිලෝමීටරයක් පමණ ඉදිරියට ගමන් කරන විට නූපේ ඇළ උඩින් දමා ඇති පාළම හමුවේ එතැන් සිට එම පාරේ මීටර් 200ක් පමණ ගමන් කරන විට මෙම දේපළ පාරේ දකුණු අත පැත්තට වන්නට පිහිටා ඇත.

3 වන උපලේඛනය

මාතර සිට හක්මණ දක්වා ගමන් ගන්නා මාර්ගයේ කිලෝමීටර් 20ක් ගමන් කර පුහුල්වැල්ල පිහිල්ල ළඟ හංදියට පැමිණ එතැනින් දකුණු අතට ඇති වළකන්ද පාරට හැරී මීටර් 800ක් පමණ ගමන් කරන විට මෙම දේපළ එම පාරේ වම් අත පැත්තේ පිහිටා ඇත.

2වන උපලේඛනය

මොරවක සිට දෙණියාය දක්වා ගමන් කරන මාර්ගයේ කිලෝමීටර් 4.5ක් පමණ ගමන් කර 66 වැනි කිලෝමීටර් කණුව අසලට පැමිණ එම කිලෝමීටර් කණුවේ සිට මීටර් 200ක් ඉදිරියට යන විට අඩි 10ක් පමණ පළල පාරක් දකුණු අත පැත්තට වන්නට ඇති අතර එම පාරේ මීටර් 150ක් පමණ ගමන් කරන විට මෙම දේපළට ළඟා විය හැකි අතර මෙම මාර්ගය තවමත් සංවර්ධනය කර නොමැත.

ගෙවීම් කළ යුතු ආකාරය. - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. පළාත්පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
06. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 1,000,
07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2,500.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිළධාරීන්ගෙන් විමසන්න.

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු.

කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය,
බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු
අංක 200, හල්ස්ඩ්‍රොෆ් වීදිය, කොළඹ 12
දුරකතන අංක 0773242954 - 0112 - 445393.

කළමණාකරු මධ්‍යගත (අයකිරීම්) අංශය),
නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී,
අංක 40, නවම් මාවත, කොළඹ 02
දුරකථන අංක : 011- 2448448.

02-576

---

හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. - බණ්ඩාරවෙල ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොළඹ ප්‍රාදේශීය සීමාව ඇතුළත අලුත්කඩේ කොට්ඨාසයේ අලුත්කඩේ නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ සිල්වර් ස්මිත් වීදිය ලෙස පෙර හැඳින්වූ බණ්ඩාරනායක මාවතේ පිහිටි බණ්ඩාරනායක මාවතේ වරිපනම් අංක 158 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. රාජේන්ද්‍ර විසින් 1963.09.30 දින පිළියෙල කළ පිඹුරුපත් අංක 2765 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට (ලොට් අංක 03හි කොටසක් වන වී. කාර්තිගේසු එල්. එස්. විසින් 1951.08.15 වැනි දින සහතික කළ පිඹුරුපත් අංක 1080 දරන පිඹුරෙන් විස්තර දක්වන කොළඹ දි. අ නඩු අංක 5516/බෙදුම් හි වාර්තාව ගොනු කළ) මායිම් වශයෙන් උතුරු සීමාවෙන් බණ්ඩාරනායක මාවත (කලින් සිල්වර්ස්මිත් වීදිය) නැගෙනහිරින් බණ්ඩාරනායක මාවතේ වරිපනම් තක්සේරු අංක 166/6A දරන පරිශ්‍රය මගින් ද, දකුණින් බණ්ඩාරනායක මාවතේ වරිපනම් තක්සේරු අංක 156 දරන පරිශ්‍රය මගින් ද, බටහිරින් බණ්ඩාරනායක මාවතේ වරිපනම් තක්සේරු අංක 156 යන පරිශ්‍රය මගින් ද මායිම් වී ඇත.

ඉඩමේ ප්‍රමාණය බලයලත් මිනින්දෝරු එස්. රාජේන්ද්‍රන් විසින් පිළියෙල කරන ලද 1963.09.30 දිනැති අංක 2765 දරන පිඹුරු පතට ප්‍රකාරව ඉඩමේ ප්‍රමාණය පර්චස් බිංදුවයි දශම හතයි පහකි (අ. 0, රූ. 0, පර්. 0.75)

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් 2017 අගෝස්තු මස 28 වැනි දින සහතික කරන ලද්දාවූ ද හා අංක 7034 යන ණය උකස් බැඳුම්කරය සඳහා රාමනායක ආරච්චිලාගේ ප්‍රදීප් කුමාර රාමනායක යන අය උක්ත දේපළ සඳහා පොරොන්දු වූ පරිදි හැටන් නැෂනල් බැංකුව පී.එල්. සී. වෙත ගෙවීම් පැහැර හැර ඇත.

ඉහත සඳහන් කළ දේපළ 2019 මාර්තු මස 7 වැනි බ්‍රහස්පතින්දා දින පෙරවරු 10.30ට ඉඩම පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව දනුම් දෙමි.

දේපළ සඳහා වූ ප්‍රවේශය.- කොළඹ -මරදාන ශ්‍රී සංඝරාජ මාවත ඔස්සේ මැස්කොන්ස් ගොඩනැගිල්ල (දකුණු පසින්) දක්වා පැමිණ වම්පසට ශ්‍රීමත් බණ්ඩාරනායක මාවත වෙතට හැරී මීටර් 200 පමණ ඇතින් වම් පසට වන්නට තක්සේරු අංක 158 හි අදාළ වෙන්දේසි ඉඩම පිහිටා ඇත.

නිවේදනය සඳහා කරුණාකර 2018 නොවැම්බර් 16 වැනි දිනැති රජයේ ගැසට් පත්‍රය සහ 2018 නොවැම්බර් 28 වැනි දිනැති ඩේලි මිරර්, ලක්බිම සහ තිනක්කුරල් යන පුවත්පත් බලන්න.

ගෙවීමේ ක්‍රමය.- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් මුදල් ප්‍රමාණයන් මිටිය පහත හෙළීමත් සමගම ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් පාලන බලධරයා වෙත ගෙවිය යුතු පළාත් විකිණීමේ බද්ද වශයෙන් 1% ක මුදල (සියයට එකක්),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වන විකිණීමේ මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. ලිපිකරු සහ සෝෂකගේ ගාස්තුව රු. 500,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු ඇත්නම්,
6. විකිණීමේ සහතිකය සඳහා වූ මුද්දර ගාස්තුව.

ගැණුම් මිලෙන් 90%ක් ඉතිරිය ද ශ්‍රී ලංකා රජය විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු ය.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් අදළ ලියකියවිලි පහත සඳහන් නිලධාරියාගෙන් පරීක්ෂා කර බැලිය හැක. සහකාර සාමාන්‍යාධිකාරී අයකර ගැනීම්, හැටන් නැෂනල් බැංකුව (පී. එල්. සී.)

අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකතන අංක : 011- 2661816/ෆැක්ස් අංක 2661835.

ඩලස් කෙලාට්,
බලයලත් වෙන්දේසිකරුවන්.

අංක 146/3, කල්දේරා උද්‍යානය, පහළ දුටුගැමුණු වීදිය, කොහුවල
දුරකතන අංක : 011-4367467, 11 4367111
aucslk@gmail.com

02-605

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - (විදේශීය ශාඛාව)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ (කඩවත උප කාර්යාලය) බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පහළ බියන්විල ග්‍රාම නිලධාරි වසමේ, පහළ බියන්විල හි පිහිටි මහවෙල පාරේ, 2 වන පටුමගේ වරිපනම් අංක 18/01 දරන කහටගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු රත්න හෙට්ටිආරච්චි විසින් 1996 අප්‍රේල් මස 27 වැනි දින මැන සාදන ලද අංක 54/1996 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් B දරන ප්‍රමාණය පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල ඉඩම සමග ගොඩනැගිලි, සහ එහි පිහිටි සියලු දේත් සමග වේ. පාරක් සඳහා වෙන් කරන ලද ඉඩම මතින් ගමන් කිරීමේ අයිතිය ද සමග වේ.

එකී පහල බියන්විල හි පිහිටි කහටගහවත්ත නමැති ඉඩමට අංක 54/1996 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් C දරන (වෙන් කරන ලද අඩි 11ක් පළල පාර) ප්‍රමාණය පර්චස් හතරයි දශම හයයි තුන (අ. 0, රූ. 0, පර්. 4.63)

**දෙවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, සූරියපාලුව, ගමෙහි පිහිටි තැඹිලි හේන වත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. සී. එම්. එස්. විමලරත්න විසින් 2008 දෙසැම්බර් මස 03 වැනි දින මැන සාදන ලද අංක 301/2008 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 4A දරන ප්‍රමාණය පර්චස් තිස් හතරක් (අ. 0 රූ. 0 පර්. 34) විශාල ඉඩම සමග ගොඩනැගිලි, සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

එකී පහළ බියන්විල හි පිහිටි කහටගහවත්ත නමැති ඉඩමට අංක 54/1996 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් සී දරන (වෙන් කරන ලද අඩි 11ක් පළල පාර) ප්‍රමාණය පර්චස් හතරයි දශම හයයි තුන (අ. 0, රූ. 0, පර්. 4.63) විශාල ඉඩම සමග ගොඩනැගිලි, සහ එහි පිහිටි සියලුදේත් සමග වේ.

පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ කඩවත පහළ බියන්විල, අංක 117/1 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූල ස්ථාපිත සමාගමක් වූ කාසල් බිල්ඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු සහ ලලිත් රොහණ දිසානායක උකස්කරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස්කර ඇත.

මෙහි දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ කඩවත පහළ බියන්විල, අංක 117/1 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූල ස්ථාපිත සමාගමක් කාසල් බිල්ඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු සහ වික්‍රම ආරච්චිගේ ගාමිණි වික්‍රමරත්න උකස්කරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස්කර ඇත.

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව ඉහත සඳහන් දේපළ පළවන උපලේඛනයේ ලොට් B (අ. 0, රූඩ් 0, පර්. 15) වර්ෂ 2019 ක් වූ මාර්තු මස 11 වැනි දින පෙ. ව. 11.00 ට
පළවන උපලේඛනයේ ලොට් 4A (අ. 0, රූ. 0, පර්. 34) වර්ෂ 2019 ක් වූ මාර්තු මස 11 වැනි දින ප. ව. 12.00 ට ඉහත ස්ථාන වලදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2018.11.16 වැනි දින රජයේ ගැසට් පත්‍රය ලක්බිම, ද අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත් පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2019.02.15 වැනි දින රජයේ ගැසට් පත්‍රය සහ 2019.02.18 වැනි දින දිවයින, ද අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත් පත් ද බලන්න.

පළමු උපලේඛනයේ දේපළට පිවිසීම. - කිරිබත්ගොඩ හංදියේ සිට නුවර පාරේ කඩවත දෙසට කිලෝමීටර් 2.7 ක් ගමන් කර දකුණට හැරුණු විට පුෂ්පරාම පාර හමුවේ. එම පාරේ මීටර් 400ක් පමණ ගමන් කර වමට හැරුණු විට මහවෙල පාර හමුවේ. එම පාරේ මීටර් 100ක් පමණ ගමන් කර දකුණටහැරී තවත් මීටර් 100ක් පමණ ගමන් කළ හමුවන තුන් මංසන්දියේ දකුණු පසින් අදළ දේපළ පිහිටා ඇත.

දෙවන උපලේඛනයේ දේපළට පිවිසීම. - කඩවත මංසන්ධියේ සිට ගනේමුල්ල පාරේ ගනේමුල්ල දෙසට කිලෝමීටර් 4ක් පමණ ගමන් කළ විට මැයිගහමුල හංදිය හමුවේ. එතැනින් දකුණට හැරී මීටර් 500ක් පමණ ගමන් කර දකුණට හැරුණු විට හෙට්ටිකන්ද පාර හමුවේ. එම පාරේ මීටර් 400ක් පමණ ගමන් කළ විට අදළ දේපළ පාරේ පිහිටා ඇත.

ගෙවීම් කළ යුතු ආකාරය. - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. නොතාරිස් ගාස්තුව රු. 2,000,
05. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
06. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
07. ගැණුම්කරු විසින් අකාලික වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි.
08. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී. එල්. සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ විදේශීය ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් විමසන්න.

එල්. බී. සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වන්දේසිකරුවෝ තක්සේරුකරුවෝ සහ
උසාවි කොමසාරිස්වරු.

කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය,
බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු,
අංක 200, 2 වන මහල, හල්ස්ඩ්‍රොෆ් වීදිය, කොළඹ 12.
දුරකතන අංක : 077 32422954 - 0112 -445393.

කළමණාකරු අය කිරීම්,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (විදේශීය ශාඛාවේ)
අංක 21, සර් රෂීක් ෆාරීඩ් මාවත,
කොළඹ 01.
දුරකතන අංක 011-2486000
ෆැක්ස් අංකය : 011 2347717.

02-570

---

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - බණ්ඩාරවෙල ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් එච්. රාජපක්ෂ විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂන්ල් බැන්ක් පී.එල්.සී හි නමට ලියන ලද්දාවූද, 2017/11/01 වැනි දින සහතික කළ අංක 3064, දරන උකස් බැදුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම විජේසිංහ මුදියන්සේලාගේ ජීවන්ත ප්‍රසාද් ණයකරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. විසින් මා වෙත පවරා ඇති බලතලවලට අනුව අය විය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් සහ වෙන්දේසි කරුගේ ගාස්තු ඇතුළු සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී 2019 ක් වූ මාර්තු මස 22 වැනි දින ප.ව. 01.30 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය තුළ මෙදිකින්ද කොට්ඨාසයේ මහපාත කෝරළේ බණ්ඩාරවෙල නගරයේ බටහිර ග්‍රාම නිලධාරි වසමේ බණ්ඩාරවෙල නගර සභා බල සීමාව ඇතුළත පිහිටි "හබරගල පතන" නැමැති ඉඩමේ මිනින්දෝරු තැන සහතික කළ පිඹුරුපත් අංක 291 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද පිඹුරුපත් අංක 291 හි ලොට් 1 වශයෙන් දක්වෙන ඉඩම් කොටස

ප්‍රමාණය පර්චස් විස්සයි දශම දෙකයි බිංදුවයි (අ:0, රූඩ්:0, පර්. 20.20) හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි පහයි එක (හෙක්ටයාර් 0.051) විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේත් සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2018.11.16 වැනි දින රජයේ ගැසට් පත්‍රය සහ 2018.11.26 වැනි දින ලක්බිම, ඩේලිමිර සහ තිනකුරල් පුවත්පත් බලන්න.

ඉඩමට පිවිසීම .- බණ්ඩාරවෙළ නගරයේ සිට ධර්මපාල මාවත ඔස්සේ (ටෙලිකොම් කාර්යාලය අසල) මීටර් 650ක් පමණ ඉදිරියට ගමන් කල විට විශාඛා බාලිකා විද්‍යාලයේ ප්‍රධාන පිවිසුම් දොරටුව හමුවේ එතැනින් දකුණට ඇති නිවාස යෝජනා ක්‍රම පාරේ මීටර් 200ක් පමණ ගමන් කර නැවත දකුණට හැරුණු විට ඇති වාහන ගමන් කල හැකි පාරේ අදාළ දේපළ පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය - වෙන්දේසිය අවසන් වූ වහාම උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී හැටන් නැෂන්ල් බැන්ක් පී.එල්.සී වෙත ගෙවිය යුතුයි. දින 30ක් තුළ දී ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයකට (10%) මුදල ආපසු නොගෙවන අතර, දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදළ ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා:-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල,
උසාවිය පාර, කොළඹ 12,
දුරකතන අංක 011 - 2445393/011-2396520,
ෆැක්ස් අංකය : 011- 2445393.
ඊමේල් : senaservice84@gmail.com

ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අය කිරීම්),
හැටන් නැෂන්ල් බැන්ක් පී.එල්.සී.
අංක 479, ටී. බී. ජයා මාවත,
කොළඹ 10.
දුරකතන අංක 011- 2664664.

02-571

---

**හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී. - බොරලැස්ගමුව ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව)

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 04 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසියේ විකිණීම

**පළමුවන උපලේඛනය**

බලයලත් මිනින්දෝරු පී.ජයකොඩි විසින් පිළියෙල කරන ලද 1983.10.02 දිනැති අංක 315 දරන පිඹුරුපතෙහි ලොට් අංක 09 ලෙස සඳහන් සීමා නිර්ණය කොට බෙදා වෙන්කරන ලද දෙල්ගහලන්ද තලවතුගොඩ පිහිටි ඉඩම හා එහි ඇති ගොඩනැගිලි ඇතුළු සියල්ල සමඟම හෝමාගම හෙවාගම් කොරළේ පලේපට්ටු ප්‍රාදේශීය සභා බල සීමාවේ, මහරගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් තලවතුගොඩ බටහිර ග්‍රාම නිලධාරී වසමේ,ලොට් අංක 09 දරන ඉඩම උතුරින් ලොට් අංක 06 මගින්ද ,ලොට් අංක 08 මගින් නැගෙනහිරින්ද, ලොට් අංක 14 මගින් දකුණින්ද, ලොට් අංක 01 මගින් බටහිරින්ද, මායිම් වී ඇති ඉඩමේ විශාලත්වය බලයලත් මිනින්දෝරු එස්.ජයකොඩි විසින් පිළියෙල කරන ලද 1982 ඔක්තෝබර් 02 වන දිනැති අංක 315 දරන පිඹුරුපතට අනුව පර්චස් 19 කි. (A0:R0:P19)

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ.එම්.ඩී.ඒ.කේ.අධිකාරි හමුවේ 2016 ජනවාරි මස 28 දින හා අංක.2586 යන ණය උකස් බැදුම්කරය සඳහා නිමල් අබේවර්ධන, ඉසුරු උත්පල අබේවර්ධන සහ උඩුවන් ආරච්චිගේ ශෙරීන් ශර්මලීන් ජෙසින්තා පෙරේරා හවුල්කරු මර්කින් රෙස්ටුරන්ට්ස් සහ බේකර්ස් යන අය උක්ත දේපළ සඳහා පොරොන්දු වු පරිදි හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී. වෙත ගෙවීම් පැහැර හැර ඇත.

ඉහත සඳහන් කළ දේපළ 2019 මාර්තු මස 8 වන සිකුරාද දින පෙරවරු 10.30 ට ඉඩම පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියක් මඟින් විකිණෙනු ලබන බව දනුම් දෙමි.

දේපළ සඳහා වූ ප්‍රවේශය.-

කොළඹ නගරයේ ශ්‍රී ජයවර්ධනපුර මාවත හා පාර්ලිමේන්තු මාර්ගය ඔස්සේ පැලවත්තට පැමිණ දකුණු දෙසට එනම් පන්නිපිටිය දෙසට හැරී මීටර් 350ක් පමණ පසුකර තලවතුගොඩ හන්දියට පැමිණ එතැනින් වම් පසට හැරී උතුවන්කන්ද පාරට ගමන් කර මීටර් 400 පමණ හරස් මංසන්ධිය දෙසට පැමිණ එතැනින් වම්පසට හැරී වේරගල පෙදෙසට විරුද්ධව මීටර් 50 පමණ ගිය තැන වෙන්දේසි ඉඩම දකුණුපසට වන්නට පිහිටා ඇත.

නිවේදනය සඳහා කරුණාකර 2018 මාර්තු 16 වැනි දිනැති රජයේ ගැසට් පත්‍රය සහ 2018 අප්‍රේල් 2 වන දිනැති ඩේලි මිරර්,ලක්බිම සහ තිනක්කුරල් යන පුවත්පත් බලන්න.

දෙවන උපලේඛනය

බලයලත් මිනින්දෝරු එස්.වික්‍රමසිංහ විසින් පිළියෙල කරන ලද 1989.08.18 දිනැති අංක 4211 දරන පිඹුරුපතෙහි ලොට් අංක 01 ලෙස සඳහන් සීමා නිර්ණය කොට බෙදා වෙන්කරක ලද කැකුණගහවත්ත ඉඩම හා එහි ඇති ගොඩනැගිලි ඇතුළු සියල්ල සමඟම බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ ශ්‍රී ජයවර්ධනපුර මහනගර සභා බල සීමාවේ, සල්පිටි කෝරළයේ පලේපට්ටු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 525 B උඩහමුල්ල ග්‍රාම නිලධාරි වසමට අයත් උඩහමුල්ල කොට්ටාව පාරේ ලොට් අංක 1 හි වරිපනම් තක්සේරු අංක 373/A1 ඉඩම, ලොට් අංක 02 මගින් ඊශාන දිශාවෙන්ද අඩි 10 ක පාරක් මගින් ගිනිකොණ දිශාවෙන් ද (ලොට් අංක 2A පිඹුරුපත් අංක 333 හි ලොට් 2A ) ලොට් අංක 05 මගින් නිරිත දිශාවෙන්ද අඩි 15 ක පාරක් මගින් වයඹ දිශාවෙන්ද (පිඹුරුපත් අංක 674 හි ලොට් 2X) මායිම් වී ඇති ඉඩම පර්චස් 9 ක විශාලත්වයකින් යුතු බව පිඹුරුපත් අංක 4211 හි සඳහන් වෙයි. (A0.R0.P9)

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ඩී. ඒ. කේ. අධිකාරි හමුවේ 2016 ජනවාරි මස 28 දින හා අංක 2586 යන ණය උකස් බැදුම්කරය සඳහා නිමල් අබේවර්ධන, ඉසුරු උත්පල අබේවර්ධන සහ උඩුවන් ආරච්චිගේ ශෙරීන් ශර්මලීන් ජෙසින්තා පෙරේරා හවුල්කරු මර්කින් රෙස්ටුරන්ට්ස් සහ බේකර්ස් යන අය උක්ත දේපළ සඳහා පොරොන්දු වු පරිදි හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී. වෙත ගෙවීම් පැහැර හැර ඇත.

ඉහත සඳහන් කළ දේපළ 2019 මාර්තු මස 8 වන සිකුරාද දින පෙරවරු 11.30 ට ඉඩම පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියක් මඟින් විකිණෙනු ලබන බව දනුම් දෙමි.

දේපළ සඳහා වූ ප්‍රවේශය.–
කොළඹ නගරයේ ශ්‍රී ජයවර්ධනපුර මාවත හා කෝට්ටේ ජුබිලි කණුව හන්දියට පැමිණ වම්පසට හැරී පැරණි කොට්ටාව මාර්ගයෙහි මීටර 150 ක් පමණ පසුකර ඇඹුල්දෙණිය හන්දියට පැමිණි විට, අදළ ඉඩම වම් පසට වන්නට එනම් වාහන දුම් පරීක්ෂණ මධ්‍යස්ථානයට ඉදිරියෙන් විරුද්ධව පිහිටා ඇති ඉඩම පැරණි කොට්ටාව පාර, ඇඹුල්දෙණිය A වීදිය හා පළමුවන පටුමඟ යන වීදි හරහා පුළුල්ව විහිදී ඇත.

නිවේදනය සඳහා කරුණාකර 2018 මාර්තු 16 වන දිනැති රජයේ ගැසට් පත්‍රය සහ 2018 අප්‍රේල් 2 වන දිනැති ඩේලි මිරර්,ලක්බිම සහ තිනක්කුරල් යන පුවත්පත් බලන්න.

ගෙවීමේ ක්‍රමය. – මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් මුදල් ප්‍රමාණයන් මිටිය පහත හෙළීමත් සමගම ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් පාලන බලධරයා වෙත ගෙවිය යුතු පළාත් විකිණීමේ බද්ද වශයෙන් 1% ක මුදල (සියයට එකක්),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වන විකිණීමේ මිලෙන් 2 1/2% (සියයට දෙක හමාරක්),
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු.500,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු ඇත්නම්,
6. විකිණීමේ සහතිකය සඳහා වූ මුද්දර ගාස්තුව.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරියද ශ්‍රී ලංකා රජය විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු,තීරු බදු,අය බදු

හෝ ගාස්තු අය කිරීම්ද වෙතොත් ඒවාද සමඟ වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතුය.

හිමිකම් ඔප්පුව සහ අනෙකුත් අදාළ ලියකියවිලි පහත සඳහන් නිලධාරියාගෙන් පරීක්ෂා කර බැලිය හැක. සහකාර සාමාන්‍යාධිකාරී - අයකර ගැනීම්,හැටන් නැෂනල් බැංකුව ( පී.එල්.සී.)

අංක: 479, ටී. බී. ජයා මාවත, කොළඹ -10.
දුරකතන අංක : 011-2661816/ෆැක්ස් අංක.2661835

ඩලස් කෙලාට්,
බලයලත් වෙන්දේසිකරුවන්.

අංකඃ 146/3,කල්දේරා උද්‍යානය,
පහළ දුටුගැමුණු වීදිය,
කොහුවල.
දුරකථනඃ 11 4367467 , 11 4367111 aucslk@gmail.com

02-604

---

**සෙලාන් බැංකුව පීඑල්සී - කෝපරේට් බැන්කින් ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ පන්නිපිටිය සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත සමාගමක් වන ''කළර් සෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්'' යන අය බන්ධනදයී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව වෙත සුරක්ෂිත කර ඇත.

1 වන වෙන්දේසිය .-

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව නගර සභා සීමාව තුළ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ ඇරව්වල බටහිර 581/ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, ඇරව්වල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. පී. ජී. පියසේන විසින් සාදන ලද 2004.04.26 දිනැති අංක 1163 දරන සැලැස්මේ නිරූපනය වන රත්න මාවත, වරිපනම් අංක 545/3 දරන පරිශ්‍රය වන ලොට් 1හි නැවත මැනීමක් වන බලයලත් මිනින්දෝරු යූ. කේ. පී. ජී. එස්. පුෂ්පකුමාර විසින් අඳින ලද 2015.03.19 දිනැති අංක 3130 සැළැස්මේ නිරූපනය වන නුගගහකනත්ත නමැති ඉඩමේ ලොට් බී ලකුණු කළ ඉඩම් කොටස රූඩ් තුනයි පර්චස් පහළොවක් (අ. 0 රූ. 3 පර්. 15) සහ *නොහොත්* හෙක්ටයාර් 0.3415 ක් විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ 2019 මාර්තු මස 11 වැනි දින පෙරවරු 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**දෙවන වෙන්දේසිය**

| *උකස් බැඳුම්කර අංකය* | *යන්ත්‍ර සූත්‍ර විස්තරය* |
|---|---|
| 2008.08.29 දිනැති | ටී ෂර්ට් කියෝරිං මැෂින් |
| එෆ්සීබීයූ/එම්එම්/08/003 | අ. කන්වේ බෙල්ට් සහ යන්ත්‍ර කට්ටල 2 ක්<br>ආ. ඩ්‍රයර් යුනිට් 4 (සෙලිසියස් අංශක 200)<br>ඇ. හියරර් යුනිට් 2 මාදිලිය අංක ඃ එෆ්වයි 900, අනුක්‍රමික අංක අයිඑක්ස්4ඕඑෆ්සීඑල් |
| පන්නිපිටිය, ඇරව්වල රත්න මාවත අංක 545/3 හි බහා ඇත. | |
| 2010.07.21 දිනැති<br>එෆ්සීබීයූ/එම්එම්/10-001 | බීබී 13080 දරන ලේසර් කටිං මැෂින් 01 යි<br>මිලිමීටර් 1300x800 කටිං ඒරියා |
| පන්නිපිටිය, ඇරව්වල රත්න මාවත අංක 545/3 හි බහා ඇත. | |
| 2010.09.24 දිනැති<br>එෆ්සීබීයූ/එම්එම්/10/004 | ටෙක්ස්ටයිල් ප්‍රින්ටිං මැෂිනරී<br>එම් සහ එම්10 කලර්ස් 12 ස්ටේෂන්<br>පූර්ණ ස්වයංක්‍රීය ප්‍රින්ටිං මැෂින් සියලු උපාංග සමග |
| පන්නිපිටිය, ඇරව්වල රත්න මාවත අංක 545/3 හි බහා ඇත. | |
| 2010.09.24 දිනැති<br>එෆ්සීබීයූ/එම්එම්/10/005 | එම් සහ ආර් චැලෙන්ජර් II ඕඑස් 01 යි<br>10 ස්ටේෂන්/කලර්ස් 8<br>(සෙන්ටිමීටර් 70x100)<br>ස්වයංක්‍රිය ප්‍රින්ටර් සියලු උපාංග සමග |
| පන්නිපිටිය, ඇරව්වල රත්න මාවත අංක 545/3 හි බහා ඇත. | |
| 2010.11.26 දිනැති<br>එෆ්සීබීයූ/එම්එම්/10/006 | ඉලැන් ස්ක්‍රෘ එයාර් කම්ප්‍රෙෂර් උපාංග සමග<br>(නාම මාත්‍ර ඉන්වොයිස් අංක පීටීඑස් 3410 ඩීටීඩී 26.07.10 අනුව) සීඅයිඑෆ් කලම්බු ඉන්කො ටර්ම් 2000 |
| පන්නිපිටිය, ඇරව්වල රත්න මාවත අංක 545/3 හි බහා ඇත. | |
| 2013.04.02 දිනැති<br>එෆ්සීබීයූ/එම්එම්/13/001 | එක්ස්පෝෂර් මැෂින් (මාදිලි අංක කේවයි-56එස්පී 01 යි)<br>එම් ඇන්ඩ් ආර් ප්‍රින්ටර් 02 යි (මාදිලි අංක සීඑච්ඒ2)<br>ප්‍රෙස් මැෂින් 01 යි (මාදිලි අංක එම්ඒඑක්ස් 200 සී)<br>ප්ලෆ්පික්ස් 01 යි, ඩ්‍රයර්ස් 02 යි සහ ෆ්ලෑෂ් කියෝ 5 යි<br>(මාදිලි අංක ඃ එම්ඒඑක්ස්අයි ප්ලෆ්පික්ස්)<br>එප්සන් ප්‍රින්ටර්ස් 02 යි (මාදිලි අංක එප්සන් 9700)<br>එප්සන් ප්‍රින්ටර්ස් 02 යි (මාදිලි අංක එප්සන් 9700) |
| පන්නිපිටිය, ඇරව්වල රත්න මාවත අංක 545/3 හි බහා ඇත. | |
| 2013.04.02 දිනැති<br>එෆ්සීබීයූ/එම්එම්/13/002 | රෝල් ෆෝම් මැෂින් 01 යි<br>(මාදිලි අංක එම්යූටීඕඑච් ආර්ජේ - 90)<br>සබ්ලයිමේෂන් ප්‍රින්ටර්ස් 01 යි (මාදිලි අංක 398/456)<br>හීට් ට්‍රාන්ස්ෆර් මැෂින් 01 යි<br>(මාදිලි අංක සීවයි-001බී) |
| පන්නිපිටිය, ඇරව්වල රත්න මාවත අංක 545/3 හි බහා ඇත. | |

ඉහත සඳහන් යන්ත්‍රසූත්‍ර 2019 මාර්තු මස 11 වැනි දින පෙරවරු 11.30 ට එම කර්මාන්තශාලා පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම. - පිළියන්දල සිට කොළඹ හොරණ පාර ඔස්සේ බෝකුන්දර මංසන්ධිය දක්වා පැමිණ, දකුණු පසට ඇති මකුළුදූව පාරට හැරී තවත් මීටර් 500 ක පමණ දුරක් ගොස් වයි හංදිය දක්වා පැමිණ වම්පසට ඇති මාර්ගයට හැරී තවත් කි. මී. 1.3ක පමණ දුරක් ගිය විට දකුණු පසට ඇති රත්න මාවතට හැරෙන්න. එම රත්න මාවත ඔස්සේ තවත් මීටර් 300 ක පමණ දුරක් ගොස් වම්පසට ඇති මාර්ගයට හැරී මද දුරක් ගිය විට අදාළ දේපළ මාර්ගයේ දකුණු පසින් පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම.- රජයේ ගැසට් පත්‍රයේ 2018.12.28 වැනි දින පළවී ඇති අතර, ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත් වල 2019.01.05 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2018.12.25 වැනි දින පළ වී ඇත.

ගෙවීමේ ක්‍රමය. - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,000, 6. සියලුම ප්‍රචාරක වියදම්, 7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළතන ගෙවිය යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10 % ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. නීති ප්‍රධානී සෙලාන් බැංකුව, පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකතන අංක 011 2456457, 2456479.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොළොන්නාව.
දුරකථන අංක 011- 3068185, 011- 2572940.

02-614

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සහ 2000 අංක 54 දරන පනතින් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, අක 137 හි සී/ස සමර්විල් සහ සමාගමේ වගකීම් වෙනුවෙන් උකස් කරන ලද කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, අංක 137 හි පිහිටි දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017 අප්‍රේල් 12 දිනැති අංක 2015 දරන ගැසට් පත්‍රයේ හා 2017 මාර්තු 31 වැනිදින ''දිනමිණ'', ''ඩේලිනිව්ස්'' හා ''තිනකරන්'' යන පුවත්පත් වල පළ කරන ලද නිවේදනවලට අනුකූලව මුල් ණය මුදල් වල ශේෂය ද, විකිණීම කෙරන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍ර පිහිටි ස්ථානයේ දී ම 2019 මාර්තු 08 වැනි දින පෙ. ව. 10.00 ට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 ටී ඇන්ඩ් එච් ඔක්ෂන් හි වෙන්දේසිකාර එම්. එච්. තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**පළමු උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහ නගර සීමාවේ, කොම්පඤ්ඤ වීදියේ, වොක්ෂෝල් වීදිය දිගට පිහිටි, වොක්ෂෝල් විදියෙහි වරිපනම් අංක 137 දරන ''නෝර්විච් ස්ටෝර්ස්'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ඊ. වෝකර් විසින් සාදන ලද 1960 ජුනි 20 දිනැති අංක 259 දරන පිඹුරෙහි නිරූපිත බෙදූ ඉඩම් කැබැල්ල උතුරටඃ පාරට වෙන් කළ කොටස ද, නැගෙනහිරට ඃ වොක්ෂෝල් වීදියේ වරිපනම් අංක 141 දරන පරිශ්‍රය ද, දකුණට ඃ වෝක්ෂෝල් වීදිය සහ වෝක්ෂෝල් විදියේ වරිපනම් අංක 131 දරන පරිශ්‍රය ද, බස්නාහිරට ඃ වොක්ෂෝල් පටුමගේ වරිපනම් අංක 55/57 සහ 58 දරන පරිශ්‍ර ද මායිම්ව රූඩ් එකයි පර්චස් තිස් දෙකයි දශම අටයි අටක (අ. 0, රූ. 1, පර්. 32.88) ක බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි A කොටසෙහි, 939 වෙළුමෙහි 119 වන පත් ඉරුවෙහි ලියාපදිංචි කර ඇත.

දෙවන උපලේඛනය (පාරට වෙන් කළ කොටස)

එකී කොම්පඤ්ඤ වීදියේ, වෝක්ෂෝල් පටුමගේ පිහිටි බලයලත් මිනින්දෝරු එම්. අයි. සමීර් විසින් සාදන ලද 1957 නොවැම්බර් මස 27 හා 28 දිනැති අංක 69 දරන පිඹුරෙහි ලොට් 7 ලෙස දක්වා නිරූපණය කර ඇති ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 7 උතුරට ඃ ලොට් 1, 2, 3A, 3B හා 4 ද, නැගෙනහිරට ඃ වොක්ෂෝල් වීදියේ වරිපනම් අංක 141 දරන පරිශ්‍රය සහ ලොට් 6 හා 2 ද, දකුණට ලොට් 5A, 5B, 5C, 5D, 5E සහ 6 ද, බස්නාහිරට වොක්ෂෝල් පටුමග සහ ලොට් 1 සහ 6 ද, මායිම්ව එකී අංක 69 දරන පිඹුරට අනුව රූඩ් තුනයි පර්චස් එකොළහක (අ. 0, රූ. 3 පර්. 11) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි ඒ කොටසෙහි 904 වන වෙළුමෙහි 241 වන පත් ඉරුවෙහි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සම්බන්ධතා කළමනාකරු,
(අයකර ගැනීම් ආයතනික)

ලංකා බැංකුව,
අයකර ගැනීමේ අංශය,
3 වන මහල,
ලංකා බැංකු චතුරශ්‍රය,
අංක 1 ලංකා බැංකු මාවත,
කොළඹ 01.

2011.06.02 දින අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව සම්මත කිරීමෙන් අනතුරුව, 2017.07.04 වැනි දින අභියාචනාධිකරණ නඩු අංක CA (writ) 214/2017 හි මෙම ණය පහසුකම ද ඇතුළත්ව සමථ කොන්දේසි ඇතුළත් කරන ලද අතර, එකී සමථ කොන්දේසි ප්‍රකාරව සමාගම විසින් 2017.12.05 දින දක්වා එකී එකඟ වූ මුදලින් ගෙවන ලද කොටසින් රු. 8,686,634.72 ක් ඉහත පහසුකමට අදාළව අය වී ඇත.

02-683

---

**කිසියම් හේතුවක් නිසා ගැසට් නිවේදනයක් අවලංගු කරන්නේනම් ඒ බව එම සතියේ සඳුද දිනට පෙර දැනුම් දිය යුතුය.**

I කොටස : I ඡෙදය යටතේ පළවන දැන්වීම් සහ I කොටස : (IIආ) ඡෙදයේ වෙන්දේසි කිරීම් යටතේ පළවන ඉතිරි සියලු දැන්වීම් 2019.02.15 දින ගැසට් පත්‍රයේ පළවේ.

මුද්‍රණය හා බෙදාහැරීම ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk